# SLAASMB

## ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා




වාර්ෂික වාර්තාව 2012

# මණ්ඩලය...

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය,
1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත
මගින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්* විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ
කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම්
හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය
කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ. *(35 පිටුව බලන්න)

## පටුන


මණ්ඩලයේ සාමාජිකයින් ........ 01
තාක්ෂණික කාර්ය මණ්ඩලය ........ 06
වර්ෂයේ සමාලෝචනය ........ 08
2012 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ සොයා ගැනීම් ........ 11
2012 වසර තුළ ලබාගත් එකඟතාවන් ........ 12
2012 වර්ෂය සඳහා අස්වැසීමේ ලිපි යැවූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ ලැයිස්තුව ... 13
2012 වර්ෂය සඳහා ආධාරක ලිපි යැවූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ ලැයිස්තුව ....... 15
2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ
ලැස්තුගත සමාගම් සහ රාජ්‍ය සංස්ථා ........ 17
විගණන සමාලෝචනවල සොයාගැනීම් ........ 18
තුලිත ලකුණු පත ........ 20
විගණකාධිපති වාර්තාව ........ 21
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ........ 23
මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනය ........ 24
ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය ........ 25
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ........ 26
මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ........ 27
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ........ 35

# මණ්ඩලයේ සාමාජිකයින්

**සභාපති**

| | |
|---|---|
| මහ බැංකු අධිපති නම් කළ නියෝජිත | පී. සමරසිරි B.A. (Hons.), M.A. (Economics)<br>සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව |
| නිල බලයෙන් | ඩී.කේ. හෙට්ටිආරච්චි LLB, නීතිඥ *(2012 දෙසැම්බර් 31 දින දක්වා)*<br>ඩී.එන්.ආර්. සිරිවර්ධන B.A. (Hons.), LLB, නීතිඥ *(2013 ජනවාරි 1 දින සිට)*<br>සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් |
| | එම්. සමරසේකර මිය B.Sc., MPM<br>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |

**නම් කළ නියෝජිත**

| | |
|---|---|
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (ශ්‍රී ලං.ව.ග.ආ.) | එස්. රාජපක්ෂ MBA, FCA<br>සභාපති, ශ්‍රී ලං.ව.ග.ආ.<br>හවුල්කරු, බී.ඩී.ඕ. පාට්නර්ස් |
| | ඒ. හේරත් B.Sc., MBA, FCA<br>නියෝජ්‍ය සභාපති, ශ්‍රී ලං.ව.ග.ආ.<br>හවුල්කරු, අර්න්ස්ට් සහ යංග් |
| | ඩී.ටී.එස්.එච්. මුදලිගේ FCA, FCMA (UK), FCCA, FCPA<br>හිටපු සභාපති, ශ්‍රී ලං.ව.ග.ආ.<br>හවුල්කරු, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් |
| එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනය (ශ්‍රී ලංකා අංශය) | සී.එල්.කේ.පී. ජයසූරිය FCMA (UK), FCCA *(2012 දෙසැම්බර් 31 දින දක්වා)*<br>සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂක, ෆින්ලේස්, කලම්බෝ පී.එල්.සී. |
| | වී.එම්. ගුණතිලක MBA, FCA, FCMA (UK), FCPA *(2013 ජනවාරි 22 දින සිට)*<br>ප්‍රධාන සමාගම් නිලධාරි/අධ්‍යක්ෂක, එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහය |
| ශ්‍රී ලංකා නීතිඥ සංගමය | එෆ්.එන්. ගුණවර්ධන නීතිඥ, MBA, ACA, ACMA (UK), CFA<br>හවුල්කරු, නිත්‍ය හවුල්කරුවන් |
| ලංකා වාණිජ මණ්ඩලය | එන්. සිවප්‍රගාසම් මෙනවිය FCA, FCMA (UK)<br>ප්‍රධාන මූල්‍ය නිලධාරි, එයිට්කන් ස්පෙන්ස් පී.එල්.සී. |
| ශ්‍රී ලංකා කර්මාන්ත, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය | ඩබ්.කේ.එච්. වෙගපිටිය B.Sc., MBA<br>සභාපති, ලාෆ්ස් හෝල්ඩිංස් සමාගම |
| ශ්‍රී ලංකා බැංකු සම්මේලනය | ආර්. ත්‍යාගරාජා MBA (ක්‍රැන්ෆීල්ඩ්), FCA, FCMA (UK)<br>හිටපු කළමනාකාර අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි, හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | කේ.එස්.ටී.එස්. ජයසූරිය මිය ACA<br>මූල්‍ය අධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලය |
| මණ්ඩලයේ ලේකම් | ඒ. එස්. රත්නායක FCA, FCMA (UK), ACCA, CMA, FCMI, FCMA, CGMA<br>අධ්‍යක්ෂ ජනරාල් |

# මණ්ඩලයේ සාමාජිකයින්



**පී. සමරසිරි** - *B.A. (Hons.), M.A. (Economics)*

වර්ෂ 2009 සිට මණ්ඩලයේ සභාපති වන පී. සමරසිරි මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරයෙකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 30 කට අධික සේවාකාලයක් සපුරන මොහු එහි මූල්‍ය මණ්ඩලයේ ලේකම් තනතුරද හොබවයි. මොහුගේ පුළුල් දැනුම් පරාසය ආර්ථිකමය, මූල්‍ය ස්ථාවරත්වය හා රීතීන් වැනි ක්ෂේත්‍ර දක්වා විහිදේ. තවද මොහු ආර්ථික, බැංකු හා මූල්‍ය රීතීන් සම්බන්ධ ලිපි හා පොත්ද රචනා කර ඇත.



**එෆ්.එන්. ගුණවර්ධන** - *නීතිඥ, MBA, ACA, ACMA (UK), CFA*

ගුණවර්ධන මහතා නීති ආයතනයක් වන නිත්‍ය හවුල්කරුවන්ගේ ආදිකර්තෘ හවුල්කරු වෙයි. මොහු නීතිපති දෙපාර්තමේන්තුවේ හා අර්න්ස්ට් සහ යංග් ආයතනයේ (බදු අංශයේ) සේවය කිරීමෙන් ලත් අත්දැකීම්වලින් හෙබි පුළුල් පරාසයක විහිදෙන විශේෂතාවලින් සපිරි පුද්ගලයෙකි. එසේම, මොහු මූල්‍ය නීතිය, සමාගම් ඒකාබද්ධ කිරීම් හා අත්පත්කරගැනීම්, ණය හා ස්කන්ධයන් නිකුත් කිරීම්, බදු, සුරැකුම්කරණය හා ව්‍යුත්පන්න යන ක්ෂේත්‍රයන්හි විශේෂඥවරයෙකුද වෙයි.



**වී.එම්. ගුණතිලක** - *MBA, FCA, FCMA (UK) , FCPA*

ගුණතිලක මහතා එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහයේ ප්‍රධාන සමාගම් නිලධාරි/අධ්‍යක්ෂක ධූර දරන අතර වසර 25 ඉක්මවන මෙරට සහ ජාත්‍යන්තර ආයතන වලින් ලත් අත්දැකීම් වලින් පරිපූර්ණය. ඔහු සික්ස් සිග්මා සහතික ලාභියෙකි. ඔහු එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති ධූරය දරනු ලැබේ.



**ඒ. හේරත්** - *B.Sc., MBA, FCA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ නියෝජ්‍ය සභාපති ධූරය හොබවන හේරත් මහතා අර්න්ස්ට් සහ යංග් ආයතනයෙහි හවුල්කරුවෙකි. මොහු ශ්‍රී ලංකාවේ සමාගම් බොහෝමයක විගණන කමිටුවල සාමාජිකයෙකු වශයෙන් සේවය කරන අතර ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්ද සේවය කර තිබේ. ඔහු වර්තමානයේ, ආයෝජන මණ්ඩලයේ කිරි කර්මාන්තය සංවර්ධනය සඳහා වූ මෙහෙයුම් බලකායේ සාමාජිකයෙකු ද වෙයි.

SLAASMB
ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# මණ්ඩලයේ සාමාජිකයින්

පින්තූරයේ නොමැත

**ඩී.කේ. හෙට්ටිආරච්චි** - *LLB, නීතිඥ*

නීතිඥවරයෙකු හා කොළඹ සරසවියේ නීතිවේදී උපාධිධරයෙකුද වන හෙට්ටිආරච්චි මහතා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර හෙබවිය. මොහු සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ වසර 25 ට වඩා වැඩි කාලයක් සේවය කරන ලද අතර, එහි රෙජිස්ට්‍රාර් තනතුරෙහි 1997 සිට සේවය කර තිබේ. මොහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත්වූ සාමාජිකයෙකුද වී තිබේ.



**කේ.එස්.ටී.එස්. ජයසූරිය මිය** - *ACA*

මෙතුමිය කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධිකාරී තනතුර හොබවන්නීය. ඊට ප්‍රථම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධීක්ෂකවරියක ලෙස සේවය කර ඇත. ඇය ඉන්දියාවේදී හා එක්සත් රාජධානියේදී ලත් පුහුණුවීම් හා රාජ්‍ය අංශයේ සේවය කිරීමෙන් ලත් නිපුණත්වයෙන්ද පරිපූර්ණය.

පින්තූරයේ නොමැත

**සී.එල්.කේ.පී. ජයසූරිය** - *FCMA (UK), FCCA*

ජයසූරිය මහතා, සී/ස ෆින්ලේස් කලම්බෝ හි සභාපතිවරයා මෙන්ම කළමනාකරණ අධ්‍යක්ෂකවරයාද වෙයි. මොහු වෙළඳ සේවක අර්ථසාධක සංගමයේ සභාපති, ලංකා සේවක සංගමයේ හිටපු සභාපති, එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු හා ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ කමිටු සාමාජිකයෙකුද වෙයි.



**ඩී.ටී.එස්.එච්. මුදලිගේ** - *FCA, FCMA (UK), FCCA, FCPA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හිටපු සභාපති වන මුදලිගේ මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන කවුන්සිලයේ 1997 සිට සේවය කරයි. මොහු ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්හි හවුල්කරුවෙකි. මොහු මෙරට සහ පිටරට විශාල ලැයිස්තුගත පොදු සමාගම්වල සේවය කිරීමෙන් ලත් පුළුල් දැනුම් සම්භාරයකින් පරිපූර්ණය. මුදලිගේ මහතා එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස හා විවිධ නෛතික මණ්ඩල හා ව්‍යවස්ථාපිත කමිටුවල සේවය කරයි.

# මණ්ඩලයේ සාමාජිකයින්



**එස්. රාජපක්ෂ** - *MBA, FCA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපතිධූරය හොබවන රාජපක්ෂ මහතා බී.ඩී.ඕ පාර්ට්නර්ස්හි කළමනාකරණ හවුල්කරුය. දකුණු ආසියාතික ගණකාධිකරණ සම්මේලනයේ මණ්ඩල සභිකයෙකුද වන මොහු ආසියානු ඒකාබද්ධ ගණකාධිකරණ සම්මේලනයේ තාක්ෂණික උපදේශකවරයා ලෙසද කටයුතු කරයි. එසේම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

පින්තූරයේ නොමැත

**එම්. සමරසේකර මිය** - *B.Sc., MPM*

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් තනතුර දරන සමරසේකර මිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වසර 34 ක සේවාකාලයක් සපුරයි. ඇය බදු පරිපාලනයේ විවිධ අංගයන් සම්බන්ධයෙන් ලද විදේශීය පුහුණුවීම්වලින් පරිපූර්ණය.



**ඩී.එන්.ආර්. සිරිවර්ධන** - *B.A. (Hons.), LLB, නීතිඥ*

සමාගමේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ වසර 25 කට වඩා වැඩි සේවාකාලයක් ඇති සිරිවර්ධන මහතා, එහි සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර හොබවයි. නීතිඥයෙකු වන මොහු භූගෝලය සම්බන්ධ උපාධිධාරියෙකි. තවද ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් *LLM* උපාධිය හදාරා ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින්නේය.



**එන්. සිවප්‍රගාසම් මෙනෙවිය** - *FCA, FCMA (UK)*

මෙතුමිය එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය වන අතර, සමූහයේ විවිධ සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩලයන්හිද කටයුතු කරයි. මෙතුමිය එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාවේ පාලක මණ්ඩලයේ සාමාජිකාවක වන අතර, විවිධ නෛතික මණ්ඩල හා ව්‍යවස්ථාපිත කමිටුවලද සාමාජිකත්වය දරන්නීය.

# මණ්ඩලයේ සාමාජිකයින්



**ආර්. තයාගරාජා** *- MBA (ක්‍රැන්ෆීල්ඩ්) FCA, FCMA (UK)*

තයාගරාජා මහතා හැටන් නැෂනල් බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී තනතුර හෙබවූ අතර, වර්ෂ 27 ක් ඉක්මවන මෙරට සහ යුරෝපයේ ලත් බැංකු අත්දැකීම්වලින් පරිපූර්ණය. එසේම මොහු මෙම සමාගම් සමූහයේ සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩලවලද සාමාජිකත්ව දරා ඇත.

මොහු එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද, විවිධ නෛතික මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන හා කමිටුවලද සේවය කරයි.

මොහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ හා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙකුද වන අතර, ආසියානු බැංකුකරුවන්ගේ සංගමයේ සභාපති ධූරය දරන ප්‍රථම ශ්‍රී ලාංකිකයා ද වෙයි.



**ඩබ්.කේ.එච්. වෙගපිටිය** *- B.Sc., MBA*

වේගපිටිය මහතා ලාෆ්ස් හෝල්ඩිංස් සමාගමේ, විධායක සභාපතිවරයා මෙන්ම ආදිකර්තෘද වෙයි. පුළුල් පරාසයක විහිදුනු ව්‍යාපාරික අත්දැකීම් වලට අමතරව ඔහු, ලන්ඩනයේ ඔක්ස්ෆර්ඩ් සරසවියේ බලශක්ති පාසැලෙන්, බලශක්ති කළමනාකරණය පිළිබඳව පාඨමාලාවක්ද හදාරා ඇත. මෙතුමා 2006 වර්ෂයේදී වසරේ ව්‍යවසායකයා ලෙස ප්ලැටිනම් සම්මානයෙන්ද, ඉන්දියාවේ දී පැවති ආසියානු අවබෝධතා නායකත්ව සංවිධානය විසින් මෙහෙයවූ ව්‍යවසායකත්ව විශිෂ්ඨතා - 2007 දී, නිපුණතාවය සඳහා වූ ආසියානු නායකත්ව සම්මානයෙන්ද පිදුම් ලැබීය.



**ඒ.එස්. රත්නායක** *- FCA, FCMA (UK), ACCA, CMA, FCMI, FCMA,CGMA*

*අධ්‍යක්‍ෂ ජනරාල්/මණ්ඩලයේ ලේකම්*

රත්නායක මහතා වර්ෂ 1998 දී මණ්ඩලයේ පළමු අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් විය. මොහු වරලත් ගණකාධිකරණ අවසන් අදියරේ හා පශ්චාත් උපාධි මට්ටමේ ත්‍යාගලාභියෙකි. එසේම මොහුගේ වෘත්තිය තුළ දේශීය සහ විදේශීය ගණකාධිකරණ ක්ෂේත්‍රයන් සඳහා ක්‍රියාකාරී දායකත්වය සපයා ඇත. රත්නායක මහතා, දේශීය සහ බහුජාතික පෞද්ගලික සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන මූල්‍ය නිලධාරී යන තනතුරු දරා ඇති අතර, එම සමාගම්වල අධ්‍යක්‍ෂකවරයෙකු ලෙසද සේවය කර ඇත.

# තාක්ෂණික කාර්ය මණ්ඩලය



**අජිත් එස්. රත්නායක**

*FCA, FCMA (UK), ACCA, CMA, FCMI, FCMA, CGMA*

අධ්‍යක්ෂ ජනරාල්



**අනූෂා අයි. මොහොට්ටි මිය**

*FCA, FCMA (UK), BBA (Hons.)*

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්



**හෆ්සා බානු රසාක් මෙනෙවිය**

*ACA, CIMA (Pass Finalist)*

තාක්ෂණික කළමනාකරු



**ඩබ්ලියු. ජී. එරංගා අමරසී මෙනෙවිය**

*ACA, B.Sc. (Acc)Sp. (Hons.), MBS (Colombo)*

තාක්ෂණික කළමනාකරු



**මහේෂා ලක්මාලි හේවගේ මෙනෙවිය**

*ACA*

තාක්ෂණික කළමනාකරු



**කළණි හෙට්ටිආරච්චි මිය**

*ACA, B.Sc. (Acc)Sp. (Hons.)*

සහකාර තාක්ෂණික කළමනාකරු



**එල්. වත්සලා මල්ලවාරච්චි මිය**

*ACA, B.Sc. (Acc) Sp. (Hons.)*

සහකාර තාක්ෂණික කළමනාකරු



**දිලිනිකා මින්මෙන්දආරච්චි මිය**

*ACA, B.Sc. (Acc) Sp. (Hons.)*

සහකාර තාක්ෂණික කළමනාකරු

# තාක්ෂණික කාර්ය මණ්ඩලය



**ගයනි එල්. පෙරේරා මිය**
*FCA, MBA (Finance)*
තාක්ෂණික කළමනාකරු



**ආශා අහමත් මිය**
*ACA*
තාක්ෂණික කළමනාකරු




**මොනිටා එන්. බණ්ඩාර මිය**
*ACA, BB Mgt. (ACC)*
තාක්ෂණික කළමනාකරු



**ඩී.එම්. නිලන්ති දන්දෙනි මිය**
*ACA, BBA (Acc) Sp. (Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු



**රන්දිමා ද සිල්වා මිය**
*ACA, B.Sc. (Acc) Sp.(Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු



**ඉෂාරි මනුෂ්කා සිල්වා මෙනෙවිය**
*ACA, BBA (Acc) Sp. (Hons.)*
සහකාර තාක්ෂණික කළමනාකරු

# වර්ෂයේ සමාලෝචනය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (SLAASMB), 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් සංස්ථාපනය කරන ලදී. පනතේ සඳහන් නිර්වචන සහ මිනුම් දණ්ඩයන්ට අනුකූලව ඇතැම් ව්‍යවසායයන්, (පිටු අංක 35 බලන්න) නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස හඳුන්වා ඇත. මෙම ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළයුතු අතර, ඒවායේ විගණකවරුන්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළයුතු වේ. පනතට අනුව, මෙම ව්‍යවසායයන්ගේ වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල බවට අධීක්ෂණය කිරීම සඳහා SLAASMB වෙත ඉදිරිපත් කළයුතු වේ. SLAASMB හි කාර්යයභාරයන් වන්නේ SLAASMB වෙත ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, විගණන සමාලෝචනය කිරීම, ප්‍රමිතීන්ට අනුකූලවීමට අපොහොසත් වීම් විමර්ශනය කිරීම සහ ව්‍යවසායයන් සහ විගණකවරුන් අනුකූල කරවීමට අදාළ නිවැරදි කිරීම් කරවීමට පියවර ගැනීමයි.
මෙම කාර්යය පහසු කිරීම පිණිස, SLAASMB විසින් ප්‍රමිති සම්මත කිරීම පිණිස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයට වාර්ෂික ප්‍රදානයක් වශයෙන් මූල්‍ය ආධාර සපයනු ලබන අතර, අදාළ ජාත්‍යන්තර ආයතන සමගද සම්බන්ධතා පවත්වනු ලැබේ. ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීම සඳහා SLAASMB විසින් කරගෙන යන මෙහෙයයන් හා ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

**2.1** SLAASMB විසින් 2012 දෙසැම්බර් 31 දිනට ආයතන 1,313 ක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස හඳුනාගෙන තිබුණි. වර්ෂය තුළදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1,253 ක මූල්‍ය ප්‍රකාශන 1,443 ක් SLAASMB වෙත ලැබී තිබුණ අතර, SLAASMB විසින් නියැදි පදනම මත තෝරාගත් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 302 ක ගේ මූල්‍ය ප්‍රකාශන 295 ක සමාලෝචන නිම කරන ලදී. මෙම නියැදිය, අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ සමාලෝචනවල වැදගත් භාවය අනුව විවිධ ප්‍රභේදයන්ට අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගෙන් සමන්විත විය. (පෙර වසරේදී SLAASMB විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 213 ක ගේ මූල්‍ය ප්‍රකාශන 195 ක සමාලෝචන නිම කරන ලදී).

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූල නොවීම හේතුවෙන් තම මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය ක්‍රියාකාරකම් බොහෝ සෙයින් වෙනස් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 8 ක් හඳුනාගන්නා ලදී. රාජ්‍ය සංස්ථාවන් විසින්, රු. බිලියන 2.3 ක ගැලපීම් කිරීමට එකඟතාවක් ලබා දුන් අතර පෞද්ගලික අංශයේ සමාගම්වල මූල්‍ය ප්‍රකාශයන්හි ශුද්ධ ලාභය/වත්කම්වල අගය වෙනස්වීම සම්බන්ධව ලබාගත් එකඟතාවන්වල අගය රු. බිලියන 1.1 ක් විය. (2012 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ සොයා ගැනීම් සඳහා 11 පිටුව සහ 2012 වසර තුළ ලබාගත් එකඟතාවන් සඳහා 12 පිටුව බලන්න). මෙම එකඟතාවන්ට අනුකූලව ඊළඟ වසරේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත්දැයි ඉදිරියේදී සොයා බලනු ලැබේ.

**2.2** වටිනාකමින් වැදගත් වූ නමුත් නීතිමය නියමයන් මාර්ගයෙන් ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් නොවූ ආකාරයේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථාවන්හි, එම අනුකූල නොවීම් උපකාරක ලිපි මගින් දන්වනු ලැබේ. වර්ෂය තුළ මෙවැනි උපකාරක ලිපි 138 ක් නිකුත් කර තිබේ.

**2.3** SLAASMB විසින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සමඟ සුවිශේෂී අනනුරූපතාවක් පිළිබඳ කරුණක් නිරීක්ෂණය නොකළ අවස්ථාවන් වල සීමිත විෂය පථයකින් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන පදනම් කරගෙන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත අස්වැසීමේ ලිපි නිකුත් කිරීම ආරම්භ කර තිබේ. වර්ෂය තුළ අස්වැසීමේ ලිපි 92 ක් නිකුත් කර තිබේ.

## 3. විගණන සමාලෝචනය

වර්ෂය තුළදී SLAASMB විසින්, ක්‍රියාකාරී ගණකාධිකරණ ආයතන 28 ක් විසින් සිදු කරන ලද විගණන 50 ක සමාලෝචන නිමකරන ලදී. එයට සාපේක්ෂව පෙර වර්ෂයේදී, විගණන ආයතන 17 ක් විසින් සිදුකරන ලද විගණන 30 ක සමාලෝචන නිමකරන ලදී. කරනලද සමාලෝචන වලින් ආයතන 26 ක් මගින් සිදුකළ විගණන 33 ක අඩුපාඩු හඳුනාගත් අතර, වැදගත් බවින් යුතු සොයා ගැනීම් සම්බන්ධව අදාළ විගණන ආයතන දැනුවත් කරන ලදී. (විගණන සමාලෝචනවල සොයා ගැනීම් සඳහා 18 සහ 19 පිටු බලන්න).

## 4. විමර්ශන

**4.1** සීමාසහිත ටච්වුඩ් සමාගම, මණ්ඩලය විසින් නිකුත්කරන ලද මාධ්‍ය ප්‍රකාශනයේ සඳහන් තීරණය ඉවතලීම පිණිස අභියාචනා අධිකරණයෙන් අයැදුම් කර තිබුණ අතර, අභියාචනා අධිකරණය එම ඉල්ලීමට අවසරදී ඇත. අභියාචනා අධිකරණයේ එම තීන්දුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මණ්ඩලය වෙත විශේෂ අවසරයක් ලබා දෙන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණයට කළ එම අභියාචනය සම්බන්ධව වසර අවසානය දක්වා තීන්දුවක් ගෙන නොතිබින.

## 5. ප්‍රමිති ස්ථාපනය කිරීමට දැක්වූ සහයෝගය

**5.1** SLAASMB මගින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට රු. මිලියන 2.5 ක ප්‍රදානයක් මේ වසර තුළද ලබාදී තිබේ. මෙම ප්‍රදාන, ගිණුම් ප්‍රමිති කමිටුවේ සහ විගණන ප්‍රමිති කමිටුවේ කටයුතුවලට දායක වීම මගින් තත්ත්වයෙන් ඉහළ ප්‍රමිති ස්ථාපනයට ඉවහල්වී, SLAASMB හි කාර්යභාරය නිවැරදිව ඉටු කිරීමට පිටිවහලක්වී තිබේ.

# වර්ෂයේ සමාලෝචනය

**5.2** ගිණුම්කරණ හා විගණන ප්‍රමිතිවල සංශෝධන සම්බන්ධයෙන් වර්ෂය තුළ ක්‍රියාත්මකවූ මූලික ක්‍රියාකාරකම් නම් -

- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 10 (SLFRS 10) - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 11 - බද්ධ සැකසුම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 12 - වෙනත් ආයතන කෙරෙහි ඇති අල්ම හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 - සාධාරණ අගය ඇගැයීම යන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හතර (4), ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන කවුන්සලයේ සම්මතය සඳහා නිර්දේශ කිරීම. 2013 ජනවාරි මාසයේ දී, කවුන්සලය විසින් අදාළ ප්‍රමිතීන් ක්‍රියාත්මක (බලපවත්වන) දිනය 2014 ජනවාරි 1 දින තෙක් කල් දමනු ලැබිය.
- වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති අංක පහ (5) යටතේ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) ගේ 2009 වෙළුම මත පදනම්ව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති තිස් අටක් (38) සඳහා වූ වෙනස්කම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන කවුන්සලය වෙත ඉදිරිපත් කිරීම. SLFRS 10, 11, 12 සහ 13 යන ගිණුම්කරණ ප්‍රමිති ක්‍රියාත්මක වන දිනය 2014 ජනවාරි 1 දින තෙක් කල් දමුනු ලැබීම නිසා මෙම වෙනස්කම් පිළිනොගැනීමට කවුන්සලය විසින් 2013 ජනවාරි මාසයේදී තීරණය කිරීම.
- නිර්දේශිත ක්‍රියාමාර්ග ප්‍රකාශක (SoRPs) දෙකක් (2) ගැසට් කිරීම.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන කවුන්සලය මගින් අනුමත කරනු ලැබූ නිර්දේශිත රීතීන් තුනක් (3), 2012 නොවැම්බර් 26 දින ගැසට් කිරීම.
- පැහැදිලි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර විගණනය සහ තත්ත්ව පාලන ප්‍රමිති අත්පොතේ 2009 වෙළුම මත පදනම් වූ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති තිස් හයක් (36) සහ තත්ත්ව පාලන 1 (SLSQC1) ට අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතිය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීගේ ආයතන කවුන්සලය මගින් අනුමත කර ගැසට් කිරීම සඳහා යොමු කිරීම.

## 6. ජාත්‍යන්තර සබැඳියාවන්

**6.1** SLAASMB ට ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්ව ඉසිලීම මගින්, ගිණුම් වාර්තාකරණය, විගණනය සහ ප්‍රමිතීන්ට අනුකූලවීම් සමාලෝචනය යන කාර්යයන්හි ගෝලීය වර්ධනය සම්බන්ධව මනා දැනුමක් ලැබී තිබේ. තවද, එමගින් වෙනත් නියාමන ආයතන සමග තොරතුරු හුවමාරු කිරීමට සහ නියාමන ආයතන සමග සාමූහිකව කටයුතු කිරීමේ ක්‍රියාවලීන්හි නිරතවීමට මග පෑදෙනු ඇත. වර්ෂය තුළ පහත සඳහන් ජාත්‍යන්තර ආයතනවල සාමාජිකත්වය පවත්වා ගෙන යන ලදි:

- ස්වාධීන විගණන නියාමකයන්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) - SLAASMB විසින් 2007 පැවති ප්‍රථම පූර්ණ හමුවේ පටන් සාමාජිකත්වය දරනු ලැබේ.
- ජාත්‍යන්තර විගණන හා සහතික කිරීමේ ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශක හා නිර්දේශක කණ්ඩායම - SLAASMB ට 2007 දී සාමාජිකත්වය හිමි වී ඇත.
- ගණකාධිකාරීන් සඳහා වන ජාත්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශක හා නිර්දේශක කණ්ඩායම - SLAASMB ට 2009 දී සාමාජිකත්වය හිමි විය.
- ජාත්‍යන්තර තක්සේරු ප්‍රමිති කමිටුව (IVSC) - SLAASMB ට 2008 දී සාමාජිකත්වය හිමි විය.

**6.2** SLAASMB හි සේවකයින් ගිණුම් හා වාර්තාකරණ ප්‍රමිති සඳහා වන අන්තර්රාජ්‍ය කාර්ය සාධන කණ්ඩායමේ (ISAR) හි දී ශ්‍රී ලංකාව නියෝජනය කරනු ලැබිය.

**6.3** SLAASMB හි අධ්‍යක්ෂ ජනරාල්, ජාත්‍යන්තර තක්සේරු ප්‍රමිති කමිටුවේ (IVSC) වාණිජ වන කළමනාකරණ ව්‍යාපෘතියේ සාමාජිකයෙකු ලෙස සේවය කළේය.

## 7. ජනතාව දැනුවත් කිරීමට ගත් පියවර

**7.1** මණ්ඩලය වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සඳහන් පුවත්පත් දැන්වීම් පෙළක් පල කරන ලදී.

## 8. සමාලෝචන මඩුල්ල

SLAASMB විසින් සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව ඉහළ නැංවීමේ පියවරක් ලෙස පත්කරගන්නා ලද සමාලෝචන මඩුල්ල වසර තුළ දී ද ක්‍රියාත්මක විය. එම මඩුල්ල 15 දෙනෙකුගෙන් සමන්විත විය. වර්ෂය තුළ දී සමාලෝචන මඩුල්ල විසින් මූල්‍ය ප්‍රකාශන 216 ක මූලික සමාලෝචන නිම කරන ලදී. එසේ නිම කරන ලද සමාලෝචන සම්පූර්ණ කිරීම පිණිස SLAASMB හි තාක්ෂණික නිලධාරීන් විසින් සිදුකළ යුතු ක්‍රියාවලියට අදාළ අතිරේක තොරතුරු ලබාගැනීම, අදාළ නිවැරදි කිරීම් කරන බවට ව්‍යවසායයන් ගෙන් එකඟතාවන් ලබාගැනීම සහ උපකාරක ලිපි නිකුත් කිරීම ආදී කටයුතු ඇතුළත් වේ.

## 9. මානව සම්පත් සංවර්ධනය

**9.1** 2012 වර්ෂය අවසානය වන විට මණ්ඩලය සේවකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, එයින් 6 දෙනෙක් වරලත් ගණකාධිකාරීහු වූහ. වර්ෂය තුළ දී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ යෝජනාවක් මත මුදල් අමාත්‍යාංශය අනුමත කළ දිරි දීමනා පටිපාටිය ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක් ලෙස වෘත්තීය සුදුසුකම් ඇති තාක්ෂණික නිලධාරීන් බඳවා ගැනීමට හැකි විය. 2012 අගභාගයේ තාක්ෂණික නිලධාරීන් බඳවා ගැනීමට දැන්වීම් පල කළ අතර 2013 මුල් භාගයේ අමතර තාක්ෂණික තනතුරු 8 ක් සඳහා නිලධාරීන් බඳවා ගනු ලැබිය.

**9.2** තාක්ෂණික කාර්ය මණ්ඩලයට මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ නියාමනය සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු කිරීමේ වැඩසටහන් වලට සහභාගීවීමේ අවස්ථා 7 ක් මෙම වර්ෂය තුළ දී උදාවිය.

# වර්ෂයේ සමාලෝචනය

## 10. පාලන පටිපාටිය

**10.1** මණ්ඩලය නිල බලයෙන් පත්වූ සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සහ මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා විසින් පත් කළ සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත වෙයි. සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 'නිල බලයෙන් පත්වූ' සාමාජිකයෝ වෙති. 'පත් කළ' සාමාජිකයෝ පහත සඳහන් ආයතන නියෝජනය කරති:

- ශ්‍රී ලංකා මහ බැංකුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය (සාමාජිකයින් 3)
- එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරින්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශය
- ශ්‍රී ලංකා නීතිඥ සංගමය
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා කර්මාන්ත, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය
- ශ්‍රී ලංකා බැංකු සම්මේලනය
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**10.2** ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරයකු වන පී. සමරසිරි මහතා වර්ෂය තුළ සභාපති ලෙස කටයුතු කළේය.

**10.3** වර්ෂය තුළ මණ්ඩලයේ රැස්වීම් 8 ක් පවත්වන ලදී.

**10.4** වර්ෂය තුළ පනතට අනුව මණ්ඩලයට පත්කළ සාමාජිකයන් වූ සී.එල්.කේ.පී. ජයසූරිය, එස්. රාජපක්ෂ, ආර්. ත්‍යාගරාජා සහ ඩබ්ලිව්.කේ.එච්. වෙගපිටිය යන මහත්වරු සහ එන්. සිවප්‍රගාසම් මෙනවිය සමීක්ෂණයට භාජනය කරන ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වල අධ්‍යක්ෂධූර හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරි තනතුරු දැරූහ. එසේම පනත අනුව මණ්ඩලයට පත් කළ සාමාජිකයන් වූ ඒ. හේරත්, ඩී.ටී.එස්.එච්. මුදලිගේ සහ එස්. රාජපක්ෂ යන මහත්වරු SLAASMB විසින් සමීක්ෂණයට භාජනය කරන ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්වල විගණකරුවන් වන ක්‍රියාකාරි ගණකාධිකරණ ආයතන වල හවුල්කරුවන් වූහ. මණ්ඩලයේ ස්වාධීනත්වය පවත්වා ගෙන යනු පිණිස නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සහ ඒවායේ විගණන හා සම්බන්ධිත කරුණු හා බැඳි සියලු ලියවිලි එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායේ හෝ එහි විගණක ලෙස සම්බන්ධ සාමාජිකයා වෙත යොමු කිරීමෙන් වැලකී සිටී. තවද, එම සාමාජිකයන් අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය හෝ එහි විගණනය සම්බන්ධ සාකච්ඡා වලට සහභාගි නොවේ.

**10.5** වර්ෂය තුළ මණ්ඩලයේ සාකච්ඡාවන්ට සමස්ත උපදේශනය, ප්‍රතිපත්ති සම්බන්ධ තීරණ, මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම, වාර්ෂික අයවැය ලේඛනය අනුමත කිරීම සහ තාක්ෂණික ධාරිතාව වැඩි කිරීමේ මාර්ග සෙවීම ආදිය ඇතුළත් විය.

**10.6** SLAASMB හි වැඩ පැවරීමේ ප්‍රතිපත්තියට අනුරූපව නිත්‍ය ක්‍රියාවලියන් වන ප්‍රමිතීන්ට අනුකූලවීම් සමීක්ෂණයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, මූල්‍ය ප්‍රකාශන සහ විගණන සමාලෝචනය සහ විමර්ශනයන්, එහි නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද අතර, එම කටයුතු සිදු කෙරුනේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය සහ උපදේශකත්වය යටතේය.

## 11. වෙනත් ක්‍රියාකාරකම්

2012 නොවැම්බර් මස තෙක් ලැබී තිබුණු මූල්‍ය ප්‍රකාශන ස්කෑන් කිරීමේ ක්‍රියාදාමය වර්ෂය තුළ දී අවසන් විය. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ගේ මූල්‍ය ප්‍රකාශන සංරක්ෂණය කරීම මෙම ස්කෑන් කිරීමේ ක්‍රියාවලියේ අරමුණයි.

## 12. මූල්‍ය ක්‍රියාකාරකම්

**12.1** වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.40,719,864/- ක් වූ අතර, පෙර වර්ෂයේ වියදම් රු. 34,300,894/- ක් විය. වර්ෂයේ මෙහෙයුම් වියදම් වල වැඩිවීම 19% ක් විය.

**12.2** පෙර වර්ෂයේ කාර්ය මණ්ඩල පිරිවැය වූ රු. 13,235,569/- ට සාපේක්ෂව වර්ෂය තුළ පිරිවැය රු. 15,568,361/- ක් විය. එය 17% ක වැඩිවීමකි. කාර්ය මණ්ඩල පිරිවැය මණ්ඩලයේ මෙහෙයුම් වියදම් වලින් 38% ක් විය.

**12.3** දිරි දීමනා සඳහා ගෙවීම්, තාක්ෂණික නිලධාරීන් හා නියෝජ්‍ය තාක්ෂණික නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධ දැන්වීම් සඳහා වූ වියදම් සහ මූල්‍ය වාර්තා සමාලෝචනය සඳහා ගෙවූ වෘත්තීයමය ගාස්තු මෙලෙස වියදම් ඉහළ යාමට හේතු විය. මෙම වියදම් සඳහා මූල්‍ය සම්පාදන රාජ්‍ය ප්‍රදාන මගින් කරනු ලැබීය.

# 2012 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ සොයා ගැනීම්

### 1. නිවැරදි කිරීම් සඳහා එකඟතාවන් ලබා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (SLAASMB) විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් අටකගෙන් එම ව්‍යවසායයන්ගේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීම් සඳහා එකඟතාවන් ලබා ගන්නා ලදි. ශුද්ධ ලාභය/හිමිකම්වල අගය වෙනස්වීම් සම්බන්ධව ලබාගත් එකඟතාවන් හි මුළු අගය රු. බිලියන 3.4 විය.

රාජ්‍ය සංස්ථාවන් දෙකක් විසින් ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනයන් හි නිවැරදි කිරීම් රු. බිලියන 2.3 ක් සඳහා එකඟ වූ අතර පෞද්ගලික අංශයේ සමාගම් වලින් ලබාගත් එකඟතාවයන්හි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ ලාභයට/හිමිකමට කරුනු ලබන නිවැරදි කිරීම් හි මුළු අගය රු. බිලියන 1.1 විය.

එසේ එකඟතාවන් ලබා ගන්නා ලද අයිතමයන්ගේ ස්වරූපය පහත දැක්වේ:

- ආයෝජන දේපලක් එහි සාධාරණ අගය මත ආගණනය කිරීමේදී ලැබූ ලාභය ප්‍රත්‍යාගණන අතිරික්තයක් ලෙස හඳුනාගැනීම
- අස්තිත්වයක් නොමැති ආයෝජන, වත්කම් ලෙස හඳුනාගැනීම
- පරිපාලිත සමාගම් වල කරුනු ලැබූ ආයෝජන වල අගය අඩුවීම වියෝජිත මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගැනීමට අපොහොසත් වීම
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම
- ගිණුම් වල පවතින වෙනස්කම් සැසඳීමට අපොහොසත් වීම
- අඩමාණ ණය සඳහා වෙන් නොකිරීම
- අයෝජන වල අගය අඩුවීම හඳුනාගැනීමට අපොහොසත් වීම
- රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට හා ආදායමක් ලෙස අදාළ කාල පරිච්ඡේදය තුළ හඳුනාගෙන ඒ හා සම්බන්ධ වියදම් හිලව් කිරීමට අපොහොසත් වීම
- නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම් හඳුනා ගැනීමට අපොහොසත් වීම.

### 2. උපකාරක ලිපි

නීතිමය නියමයන් මාර්ගයෙන් ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් නොවූ ආකාරයේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුකූල නොවූ අවස්ථාවල, එය දීර්ඝ ලෙස විමර්ශනය නොකර, අදාළ ව්‍යවසායයන්ට ස්ව කැමැත්තෙන් ඒ සඳහා නිවැරදි පියවර ගතහැකි වන පරිදි ලිපි මගින් දැනුම් දෙන ලදී. එම ලිපි, මණ්ඩලය විසින් නිකුත් කළ නියමයන් නොවන අතර, ඒවා නිකුත් කිරීමේ අභිප්‍රාය උපකාරක ලිපි වශයෙන් වේ.

උපකාරක ලිපි නිකුත් කිරීමට හේතු වූ මූලික සොයා ගැනීම් පහත දැක්වේ:

- අඩමාණ ණය සඳහා වෙන් නොකිරීම
- විලම්බිත බදු වගකීම් හඳුනාගැනීමට අපොහොසත් වීම
- සේවක පාරිතෝෂික සඳහා වන වගකීමේ වර්තමාන වටිනාකම ගණනය කිරීම සඳහා ප්‍රමිතියට අනුකූලව ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා නොගැනීම
- ප්‍රතයාගණන ආකෘතිය යොදා ගැනීමේ දී දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගනණය විධිමත්ව නොකිරීම
- වත්කමේ ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය විසින් පරිභෝජනය කිරීමට අපේක්ෂිත ආකාරය පෙන්නුම් කරන ක්ෂය ක්‍රමයක් වත්කම් ක්ෂය කිරීම සඳහා යොදා නොගැනීම
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඒකම ආකාරයේ ගනුදෙනු සහ එක හා සමාන තත්ත්වයන් යටතේ වූ අනෙකුත් සිදුවීම් සඳහා ඒකාකාර ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කිරීමට අපොහොසත් වීම
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඇතැම් පරිපාලිත සමාගම් අන්තර්ගත කිරීමට අපොහොසත් වීම
- බදු කුළී ඉපැයීමට හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම සඳහා ඇති දේපළ, ආයෝජන දේපළ ලෙස හඳුනා නොගැනීම
- ගිණුම්කරණ ලාභය හා බදු වියදම අතර ඇති සම්බන්ධතාව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට අපොහොසත්වීම

# 2012 වසර තුළ ලබාගත් එකඟතාවන්

**1. සීමාසහිත එන්ට්‍රස්ට් සමාගම**

සීමාසහිත එන්ට්‍රස්ට් සමාගමේ 2010 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල්වල ධාරණ අගය අයකරවා ගත හැකි අගය දක්වා අඩුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර තිබුණි.

SLAASMB පරීක්ෂණ හේතුවෙන් සමාගම විසින් 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් අඩමාණ ණය වෙන්කිරීමක් කිරීමට එකඟ විය. මේ හේතුවෙන් සමාගමේ ශුද්ධ වත්කම් බිලියනයකින් අඩු වී තිබිණි.

**2. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය**

රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය විසින් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය ප්‍රදාන ආදායමක් ලෙස හඳුනාගෙන නොමැති අතර, ඒ සම්බන්ධ වියදම් ද ගලපා නැත. මේ සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර නොතිබුණි.

SLAASMB විසින් කරන ලද පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස සංස්ථාව විසින් අදාළ රාජ්‍ය ප්‍රදාන 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට සහ ඒ සම්බන්ධ වියදම් ගැලපීමට එකඟ විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවේ ශුද්ධ වත්කම් රු. මිලියන 298 කින් වැඩි වේ.

**3. සීමාසහිත සැම්සන් රබර් (පුද්ගලික) සමාගම**

සීමාසහිත සැම්සන් රබර් (පුද්ගලික) සමාගම 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල, පරිපාලිත සමාගම්වල කර ඇති ආයෝජනවල ධාරණ අගය අඩුවීම නිසා ඇති වූ අලාභය හඳුනාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර තිබුණි.

SLAASMB පරීක්ෂණ හේතුවෙන් සමාගම විසින් 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පරිපාලිත සමාගම් වල ඇති ආයෝජනවල අගය අඩුවීම සම්බන්ධව වෙන්කිරීමක් කිරීමට එකඟ වී ඇත. මෙම බලපෑම නිසා පෙර සඳහන් කළ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් රු. මිලියන 34 කින් වැඩි වේ.

**4. සීමාසහිත සෙලින්කො ලීසිං කෝපරේෂන් සමාගම**

සීමාසහිත සෙලින්කෝ ලීසිං කෝපරේෂන් සමාගම, 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එහි පරිපාලිත සමාගම ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නොමැත. තවද, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සන්සන්දනය නොකළ රු. මිලියන 68 ක වෙනසක් තිබුණි. මෙම ගැටළු සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර තිබුණි. SLAASMB පරීක්ෂණ හේතුවෙන් සමාගම විසින් 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමටත් හඳුනා නොගත් වෙනස සැසඳීමටත් එකඟ විය.

**5. මල්ටි ෆිනෑන්ස් පී.එල්.සී.**

ලියාපදිංචි කළ මූල්‍ය සමාගමක් වන මල්ටි ෆිනෑන්ස් පී.එල්.සී., 2012 මාර්තු දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන සුරැකුම්පත්වල අගය අඩුවීම් හඳුනාගෙන නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ශුද්ධ වත්කම් රු. මිලියන 22 කින් අධිතක්සේරු විය. මේ සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර නොතිබුණි.

SLAASMB විසින් කරන ලද පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සමාගම විසින් එකී මිල කළ කොටස්වල ආයෝජන ඒවායේ සාධාරණ අගයට හඳුනා ගැනීමට එකඟ විය.

**6. සීමාසහිත සමර්විල් ස්ටොක්බ්‍රෝකර්ස් සමාගම**

සීමාසහිත සමර්විල් ස්ටොක්බ්‍රෝකර්ස් සමාගමේ ස්ථාවර තැන්පතු පෑන් ඒෂියා බැංකුවේ පවත්වාගෙන යන බව තහවුරු කිරීමට සාක්ෂි නොතිබුණි. මේ සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර තිබුණි.

SLAASMB විසින් කරන ලද පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස සමාගම විසින් 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අයකරවා ගැනීම අවිනිශ්චිත ලෙස හඳුනාගත් ආයෝජන සඳහා වෙන්කිරීමක් කිරීමට එකඟ විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ශුද්ධ වත්කම් රු. මිලියන 10 කින් අඩු වේ.

**7. ජාතික ඉතිරි කිරීමේ බැංකුව**

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ඇති වූ වගකීම් හඳුනාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර නොතිබුණි.

SLAASMB පරීක්ෂණවල ප්‍රතිඵලයක් ලෙස, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් කිරීමට එම ආයතනය එකඟ විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ ශුද්ධ වත්කම් රු. බිලියන 2 කින් අඩු වේ.

**8. සින්ග්ලංකා ස්ටෑන්ඩර්ඩ් කෙමිකල්ස් පී.එල්.සී.**

ලැයිස්තුගත සමාගමක් වන සින්ග්ලංකා ස්ටෑන්ඩර්ඩ් කෙමිකල්ස් පී.එල්.සී. 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපළ, සාධාරණ අගයට ආගණනය කිරීමෙන් ලැබූ ලාභය ප්‍රත්‍යාගණන අතිරික්තයක් ලෙස හඳුනාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර නොතිබුණි.

SLAASMB පරීක්ෂණවල ප්‍රතිඵලයක් ලෙස එම සමාගම 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ අදාළ ගැලපීම් කිරීමට එකඟ විය.

# 2012 වර්ෂය සඳහා අස්වැසීමේ ලිපි යැවූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ ලැයිස්තුව

SLAASMB විසින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සමඟ සුවිශේෂී අනනුරූපතාවක් පිළිබඳ කරුණක් නිරීක්ෂණය නොකළ අවස්ථාවන් වල සීමිත විෂය පථයකින් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන පදනම් කරගෙන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙන මෙම අස්වැසීමේ ලිපි නිකුත් කරනු ලැබේ. සීමිත විෂය පථයකින් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයක් යනු සීමිත අවස්ථාවන්හිදී හැරුණු කොට අදාළ ආයතනය මඟින් කරුණු හෝ පැහැදිලි කිරීම් ලබා ගැනීමකින් තොරව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සමඟ සුවිශේෂී අනනුරූපතාවක් පිළිබඳ අනාවරණය කරගැනීම සඳහා කරනු ලබන සමාලෝචනයන්ය. මෙම සීමිත විෂය පථයකින් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සමාලෝචන මඟින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සමඟ සුවිශේෂී අනනුරූපතාවයන් ඇති ඇතැම් අවස්ථාවන් අනාවරණය කරගැනීමේ හැකියාව පවතින බැවින් අනනුරූපීතාව අධීක්ෂණය කරන එක් මෙවලමක් ලෙස මෙම සමාලෝචන යොදා ගනු ලැබේ. එනමුදු, මෙමඟින් ඇතැම් සුවිශේෂී අනනුරූපතාවන් අනාවරණය නොවන බැවින් මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධරණ ලෙස දැක්වෙන බවට සහතික විය නොහැක. සීමිත විෂය පථයකින් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන වල විෂය පථයෙන් බැහැර වූ විශේෂී මූල්‍ය ප්‍රකාශන අයිතමයන් පිළිබඳ ඇතැම් අස්වැසීමේ ලිපිවල දක්වා ඇත.

| | **නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්** | **මූල්‍ය වර්ෂය** |
|---|---|---|
| 1 | අබාන්ස් ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 2 | ඇග්ස්ටා ෆර්ටිලයිසර් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 3 | සී/ස එලයන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 2012 දෙසැම්බර් 31 |
| 4 | සී/ස එලයන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 2012 දෙසැම්බර් 31 |
| 5 | අමානා ටකාෆුල් පී.එල්.සී. | 2012 දෙසැම්බර් 31 |
| 6 | සී/ස අමානා බැංකු සමාගම | 2012 දෙසැම්බර් 31 |
| 7 | සී/ස ඇක්විටි ස්ටොක්බ්‍රෝකර්ස් (පෞද්ගලික) සමාගම | 2012 දෙසැම්බර් 31 |
| 8 | ඒෂියන් එලයන්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. | 2012 දෙසැම්බර් 31 |
| 9 | ඒෂියන් හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපටීස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 10 | සී/ස ඇසට්ලයින් ලීසිං සමාගම | 2012 මාර්තු 31 |
| 11 | අවිවා එන්ඩීබී ඉන්ෂුවරන්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 12 | බයිරහා ෆාම්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 13 | බලංගොඩ ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 14 | බ්‍රවුන්ස් බීච් හොටෙල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 15 | කැපිටල් ඩිවලොප්මන්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් කම්පනි පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 16 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 17 | සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 18 | සී/ස සිලීස් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම | 2011 දෙසැම්බර් 31 |

| | **නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්** | **මූල්‍ය වර්ෂය** |
|---|---|---|
| 19 | සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 20 | සිලෝන් ගාඩියන් ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 21 | සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 22 | සී/ස චාටිස් ඉන්ෂුවරන්ස් සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 23 | ෂෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 24 | කළම්බු ෆෝට් ඉන්වෙස්ට්මන්ට් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 25 | කළම්බු ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 26 | කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 27 | කොමර්ෂල් ඩිවලොප්මන්ට් කම්පනි පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 28 | සී/ස කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 29 | කන්වීනියන්ස් ෆුඩ්ස් (ලංකා) පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 30 | සී/ස සමූපකාර ලීසිං සමාගම | 2012 මාර්තු 31 |
| 31 | ඩීසල් ඇන්ඩ් මෝටර් ඉන්ජිනියරින් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 32 | ඩී එෆ් සී සී බැංකුව | 2012 මාර්තු 31 |
| 33 | ඩී එෆ් සී සී වර්ධන බෑන්ක් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 34 | ඩයලොග් ආසියාටා පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 35 | ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 36 | ඉක්විටි වන් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 37 | ෆින්ලේස් කළම්බු පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 38 | ෆස්ට් කැපිටල් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 39 | ගලධාරි හොටෙල්ස් (ලංකා) පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 40 | ගුඩ් හෝප් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 41 | ගාඩියන් කැපිටල් පාට්නර්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 42 | හේලීස් එක්ස්පෝර්ට්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 43 | හේලීස් එම්ජීටී නිටින්ග් මිල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 44 | එච්එන්බී ඇෂුවරන්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 45 | හොටෙල් සර්විසස් (සිලෝන්) පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 46 | හුන්නස් ෆෝල්ස් හොටෙල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 47 | ඉන්ඩෝ-මැලේ පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 48 | ජේ.එල්. මොරිසන් සන් ඇන්ඩ් ජෝන්ස් (සිලෝන්) පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 49 | ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 50 | ජෝන් කීල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |

# 2012 වර්ෂය සඳහා අස්වැසීමේ ලිපි යැවූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් | මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 51 | කලමාසෝ සිස්ටම්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 52 | කෑගල්ල ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 53 | කොත්මලේ හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 54 | කුරුවිට ටෙක්ස්ටයිල් මිල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 55 | ලංකා අශෝක් ලේලන්ඩ් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 56 | ලංකා සෙරමික් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 57 | ලංකා අයි ඕ සී පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 58 | ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 59 | සී/ස ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බෑන්ක් සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 60 | ලක්ෂපාන බැටරීස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 61 | එල්.බී. ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 62 | සී/ස ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 63 | ලයන් බෲවරි (සිලෝන්) පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 64 | මාරවිල රිසෝට්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 65 | සී/ස එම්බීඑස්එල් රක්ෂණ සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 66 | සී/ස එම්බීඑස්එල් ඉතිරිකිරීමේ බැංකු සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 67 | මර්කන්ටයිල් ෂිපිං කම්පනි පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 68 | සී/ස මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 69 | නමුණුකුල ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 70 | නෙස්ලේ ලංකා පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 71 | ඔඩෙල් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 72 | ඔරියන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 73 | ඕවසීස් රියලිටි (සිලෝන්) පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 74 | පෙගාසස් හොටේල්ස් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 75 | සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 76 | රේණුකා සිටි හොටේල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 77 | රිච්ඩ් පීරිස් එක්ස්පෝට්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 78 | සම්පත් බෑන්ක් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 79 | සී/ස සණස සංවර්ධන බැංකු සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 80 | සතොස මෝටර්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 81 | සෙලාන් බෑන්ක් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 82 | ෂලිමාර් (මැලේ) පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 83 | සිංගර් ඉන්ඩස්ට්‍රීස් (සිලෝන්) පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 84 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 85 | ස්විස්ටෙක් (සිලෝන්) පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 86 | තලවාකැලේ ටී එස්ටේට්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 87 | ද කැන්ඩි හොටේල්ස් සමාගම (1938) පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 88 | ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 89 | උඩපුස්සැල්ලාව ප්ලාන්ටේෂන් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 90 | යූනියන් ඇෂුවරන්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 91 | විදුල්ලංකා පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 92 | වස්කඩුව බීච් රිසෝට්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |

# 2012 වර්ෂය සඳහා ආධාරක ලිපි යැවූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් | මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 1 | සී/ස ඒ බවර් සහ (පුද්ගලික) සමාගම | 2010 දෙසැම්බර් 31 |
| 2 | අබාන්ස් ඉලෙක්ට්‍රිකල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 3 | අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. | 2010 දෙසැම්බර් 31 |
| 4 | එයිට්කන් ස්පෙන්ස් හොටේල් හෝල්ඩිංස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 5 | එලයන්ස් ෆිනෑන්ස් කම්පනි පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 6 | සී/ස ඇලුටෙක් අනොඩයිසින් ඇන්ඩ් මැෂින් ටූල්ස් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 7 | අමායා ලෙෂර් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 8 | සී/ස අඹේවෙල ප්‍රඩක්ට්ස් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 9 | ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 10 | ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 11 | සී/ස ඒෂියා ඇසට් ෆිනෑන්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 12 | සී/ස ඒෂියන් ෆිනෑන්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 13 | ආසිරි හොස්පිටල් හෝල්ඩිංස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 14 | ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 15 | සී/ස ඔටෝග්‍රිල් ලංකා සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 16 | ලංකා බැංකුව | 2011 දෙසැම්බර් 31 |
| 17 | සී/ස බාර්ට්ලීට් ෆිනෑන්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 18 | සී/ස බේරුවල රිසෝට්ස් සමාගම | 2012 මාර්තු 31 |
| 19 | බේරුවල වෝක් ඉන් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 20 | සී/ස බිම්පුත් ලංකා ඉන්වෙස්ට්මන්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 21 | බෝගල ග්‍රැෆයිට් ලංකා පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 22 | සී/ස බ්‍රැන්ඩික්ස් ඇපරල් සමාගම | 2011 මාර්තු 31 |
| 23 | සී.ඩබ්ලිව්. මැකී පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 24 | සී/ස සී බී එල් ෆුඩ්ස් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 25 | සී/ස සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියැලිටි සමාගම | 2008 මාර්තු 31 |
| 26 | සී/ස සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියැලිටි සමාගම | 2009 මාර්තු 31 |
| 27 | සී/ස සෙලින්කෝ ලීසිං කෝර්පරේෂන් සමාගම | 2010 මාර්තු 31 |
| 28 | සී/ස සෙලින්කෝ සමාගම | 2011 මාර්තු 31 |
| 29 | සිලෝන් බෙවරේජ් හෝල්ඩිංස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 30 | සී/ස සිලෝන් බල්බ් ඇන්ඩ් ඉලෙක්ට්‍රිකල්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 31 | සී/ස සිලෝන් බිස්නස් ඇප්ලයන්සස් සමාගම | 2011 මාර්තු 31 |
| 32 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2010 දෙසැම්බර් 31 |
| 33 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2009 දෙසැම්බර් 31 |
| 34 | සිලෝන් ප්‍රින්ටර්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 35 | චිලව් ෆිනෑන්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 36 | සී අයි සී හෝල්ඩිංස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 37 | සිටිසන්ස් ඩිවලප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 38 | සිටි හවුසිං ඇන්ඩ් රියල් එස්ටේට් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 39 | කළම්බු ලෑන්ඩ් ඇන්ඩ් ඩිවලප්මන්ට් පී.එල්.සී. | 2010 දෙසැම්බර් 31 |
| 40 | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 41 | සී/ස කොමර්ෂල් ක්‍රෙඩිට් සමාගම | 2011 මාර්තු 31 |
| 42 | සී/ස කොපරේටිව් ඉන්ෂුවරන්ස් සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 43 | සී/ස ඩී.ආර්. මැනුෆැක්චරින් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 44 | සී/ස ඩෙල්මේජ් ෆෝසයිත් සහ සමාගම | 2011 මාර්තු 31 |
| 45 | ශ්‍රී ලංකා ඩිස්ට්ලරීස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 46 | සී/ස දිවැස ෆිනෑන්ස් සමාගම | 2012 මාර්තු 31 |
| 47 | සී/ස ඩග්ලස් සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 48 | සී/ස ඊ.ඩබ්ලිව්. බාලසූරිය සහ (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 49 | සී/ස එන්ට්‍රස්ට් සමාගම | 2010 මාර්තු 31 |
| 50 | එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 51 | සී/ස ගාමිණී සහ සහෝදරයෝ සමාගම | 2011 මාර්තු 31 |
| 52 | ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 53 | සී/ස ග්‍රාමින් මයික්‍රො ක්‍රෙඩිට් සමාගම | 2011 මාර්තු 31 |
| 54 | හපුගස්තැන්න ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 55 | සී/ස හාර්කොට්ස් සමාගම | 2010 මාර්තු 31 |
| 56 | හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 57 | හේකාබ් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 58 | හේලීස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 59 | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | 2011 දෙසැම්බර් 31 |
| 60 | හොටෙල් සීගිරිය පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 61 | සී/ස ඉන්ඩ්-ශ්‍රී ඉන්ඩස්ට්‍රියල් කෝර්පරේෂන් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 62 | සී/ස ඉන්ඩස්ට්‍රියල් ක්ලෝතින් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 63 | සී/ස ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් සමාගම | 2010 මාර්තු 31 |
| 64 | සී/ස ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 65 | සී/ස ඉන්ටර්ටී (පුද්ගලික) සමාගම | 2010 දෙසැම්බර් 31 |
| 66 | සී/ස ජනතා ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 67 | කහවත්ත ප්ලාන්ටේෂන්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 68 | කල්පිටිය බීච් රිසෝට් පී.එල්.සී. | 2012 දෙසැම්බර් 31 |
| 69 | සී/ස කැන්රිච් ෆිනෑන්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 70 | සී/ස කොෂිබා ලීසිං සමාගම | 2011 මාර්තු 31 |
| 71 | ලංකා සිමෙන්ට් පී.එල්.සී. | 2010 දෙසැම්බර් 31 |
| 72 | සී/ස ලාෆ්ස් පෙට්‍රෝලියම් සමාගම | 2011 මාර්තු 31 |
| 73 | ලෝකල් ලෝනස් ඇන්ඩ් ඩිවලප්මන්ට් ෆන්ඩ් | 2010 දෙසැම්බර් 31 |

# 2012 වර්ෂය සඳහා ආධාරක ලිපි යැවූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් | මූල්‍ය වර්ෂය |
|---|---|---|
| 74 | සී/ස ලයිසියම් ඉන්ටර්නැෂනල් ස්කූල් සමාගම | 2010 මාර්තු 31 |
| 75 | මහවැලි රීච් හොටෙල්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 76 | සී/ස මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 77 | මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 78 | මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 79 | මෙට්‍රොපොලිටන් රිසෝස් හෝල්ඩිංස් පී.එල්.සී | 2011 මාර්තු 31 |
| 80 | සී/ස මෝක්ෂා සමාගම | 2010 මාර්තු 31 |
| 81 | එම් ටී ඩී වෝකර්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 82 | නේෂන් ලංකා ෆිනෑන්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 83 | නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 84 | ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | 2010 දෙසැම්බර් 31 |
| 85 | නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 86 | ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය | 2010 දෙසැම්බර් 31 |
| 87 | සී/ස නිව් නවලෝක හොස්පිටල්ස් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 88 | ඔරියන්ට් ගාමන්ට්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 89 | පෑන් ඒෂියා බෑන්කිං කෝර්පරේෂන් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 90 | පීසී හවුස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 91 | පීසී ෆාමා පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 92 | මහජන බැංකුව | 2011 දෙසැම්බර් 31 |
| 93 | පීපල්ස් ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 94 | සී/ස පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 95 | සී/ස ප්‍රයිම් ලෑන්ඩ්ස් (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 96 | ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 97 | සී/ස පල්සස් ස්ප්ලිටින් ඇන්ඩ් ප්‍රොසෙසින් ඉන්ඩස්ට්‍රි (පුද්ගලික) සමාගම | 2011 මාර්තු 31 |
| 98 | රේඩියන්ට් ජෙම්ස් ඉන්ටර්නැෂනල් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 99 | රම්බොඩ ෆෝල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 100 | රේණුකා ඇග්‍රි ෆුඩ්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 101 | රේණුකා හෝල්ඩිංස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 102 | රෝයල් සෙරමික්ස් ලංකා පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 103 | සී/ස සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරින් සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 104 | සී/ස ස්ක්‍රීන්ලයින් (පුද්ගලික) සමාගම | 2010 මාර්තු 31 |
| 105 | සෙංකඩගල ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 106 | සී/ස සෙවනගල ෂුගර් ඉන්ඩස්ට්‍රීස් සමාගම | 2011 මාර්තු 31 |
| 107 | සෙලාන් ඩිවලප්මන්ට්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 108 | ෂෝ වොලස් ඇන්ඩ් හෙජස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 109 | සීගිරිය විලේජ් හොටෙල්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 110 | සිංගලංකා ස්ටෑන්ඩර්ඩ් කෙමිකල්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 111 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 112 | සිංහපුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 113 | සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 114 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2010 දෙසැම්බර් 31 |
| 115 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 2010 දෙසැම්බර් 31 |
| 116 | ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය | 2010 දෙසැම්බර් 31 |
| 117 | සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | 2010 දෙසැම්බර් 31 |
| 118 | සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 119 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 2010 දෙසැම්බර් 31 |
| 120 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2010 දෙසැම්බර් 31 |
| 121 | සී/ස ශ්‍රී ලංකා ස්ටේට් ට්‍රේඩිං (ජෙනරල්) කෝර්පරේෂන් සමාගම | 2009 මාර්තු 31 |
| 122 | ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම | 2011 මාර්තු 31 |
| 123 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 2011 දෙසැම්බර් 31 |
| 124 | ශ්‍රී ලංකා ජාතික ඖෂධ නීතිගත සංස්ථාව | 2010 දෙසැම්බර් 31 |
| 125 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | 2010 දෙසැම්බර් 31 |
| 126 | රාජ්‍ය දැව සංස්ථාව | 2010 දෙසැම්බර් 31 |
| 127 | සී/ස ස්ට්‍රෝම් මයික්‍රො ෆිනෑන්ස් ඒෂියා (ගරන්ටි) සමාගම | 2011 දෙසැම්බර් 31 |
| 128 | සන්ෂයින් හෝල්ඩිංස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 129 | ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 130 | සී/ස ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ලංකා සමාගම | 2011 මාර්තු 31 |
| 131 | කලම්බෝ ෆෝර්ට් ලෑන්ඩ් ඇන්ඩ් බිල්ඩිං කම්පැනි පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 132 | සී/ස ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි සමාගම | 2011 මාර්තු 31 |
| 133 | ලංකා හොස්පිටල් කෝර්පරේෂන් පී.එල්.සී. | 2010 දෙසැම්බර් 31 |
| 134 | ස්වදේශී ඉන්ඩස්ට්‍රියල් වර්ක්ස් පී.එල්.සී. | 2012 මාර්තු 31 |
| 135 | ත්‍රී ඒකර් ෆාම්ස් පී.එල්.සී. | 2011 දෙසැම්බර් 31 |
| 136 | ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී. | 2011 මාර්තු 31 |
| 137 | සී/ස ටොයෝටා ලංකා පුද්ගලික සමාගම | 2011 මාර්තු 31 |
| 138 | වැලිබල් පවර් එරත්න පී.එල්.සී. | 2012 මාර්තු 31 |

# 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය සංස්ථා

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම්:

- වණික් ඉන්කෝපරේෂන් ලිමිටඩ්

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම්:

- ඇලුෆැබ් පී.එල්.සී.
- පැල්වත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් පී.එල්.සී.
- මිරාමා බීච් හොටෙල්ස් පී.එල්.සී.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ රාජ්‍ය සංස්ථා:

- ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
- සෙන්ට්‍රල් ඉන්ජිනියරින් කන්සල්ටන්සි බියුරෝ
- සිලෝන් සෙරමික් කෝපරේෂන්*
- ලංකා විදුලිබල මණ්ඩලය
- ලංකා ධීවර සංස්ථාව
- ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය
- ලෝකල් ලෝන්ස් ඇන්ඩ් ඩිවලොප්මන්ට් අරමුදල*
- ජාතික චිත්‍රපට සංස්ථාව*
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය*
- ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- වී අලෙවි මණ්ඩලය
- ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල*
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- ශ්‍රී ලංකා කජු සංස්ථාව*
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
- රාජ්‍ය සංවර්ධන හා ගොඩනැගිලි සංස්ථාව
- ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව*
- රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව*
- රාජ්‍ය දැව සංස්ථාව*
- සමුපකාර තොග සංස්ථාව
- නාගරික සංවර්ධන අධිකාරිය*
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ රාජ්‍ය සංස්ථා:

- ලංකා නැව් සංස්ථාව*
- ජාතික කඩදාසි සමාගම*

*පසුව ඉදිරිපත් කරන ලදී.

# විගණන සමාලෝචනවල සොයාගැනීම්

### 1. පසුබිම

2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (SLAASMB) විසින් විගණන ආයතන 28 ක් විසින් කරන ලද විගණන 50 ක් සමාලෝචනය කරන ලදි. එම විගණන අතරින් විගණන 24 ක් අන්තර්ජාතික ජාලයන්ට අයත් විගණන ආයතන 6 ක් මගින් කරන ලද ඒවාය.

### 2. ප්‍රධාන සොයාගැනීම්

ආයතන 26 විසින් කරන ලද විගණන 33 ක අඩුපාඩුකම් සොයා ගන්නා ලදි. සොයාගන්නා ලද විගණන ප්‍රමිතීන්ට පටහැනි වීම්, උපකාරක ලිපි වශයෙන් අදාළ ආයතන දැනුවත් කිරීම පිණිස යවන ලදි.

ප්‍රධාන සොයාගැනීම් පහත සඳහන් වේ.

#### 2.1 ප්‍රමාණාත්මකව ලේඛනගත නොකළ අයිතම

විගණන මතය ප්‍රකාශ කිරීමට සාක්ෂි වශයෙන් ද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදුකළ බවට සාක්ෂි වශයෙන්ද, වැදගත් වූ කරුණු ලේඛනගත කිරීමේ අඩුපාඩු විගණන 17 ක විද්‍යමාන විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වල අවශ්‍යතා අනුව ලේඛනගත නොකළ තොරතුරු අයිතම පහත දැක්වේ:

- විගණනයේ ස්වභාවය, ඒ ඒ කාර්යය ඉටු කළ අවස්ථාවන්, ඉටු කළ ප්‍රමාණයන් සහ ඒවායේ ප්‍රතිඵල සොයාගත් අඩුපාඩු වලට ඒකාබද්ධ කිරීමේදී ඇතිවූ ඍණ කීර්තිනාමය, පාරිතෝෂික සම්බන්ධ භාරකාර ඔප්පුව හා දේපළ පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී වූ පාඩුව පිරික්සීම සඳහා කරන ලද වැඩ සම්බන්ධයෙන් සාක්ෂි නොතිබීම ඇතුළත්ය.
- විගණනය සැලසුම් කිරීම සහ විගණන වැඩ සටහන
- ආයතනයට අදාළ වන්නා වූ කර්මාන්තයේ සහ ආර්ථික හා නීතිමය පසුබිම් පිළිබඳ විස්තර

  නිදර්ශන:

  - ව්‍යාපාරයක ප්‍රධාන ව්‍යාපාරික බාණ්ඩයක කටයුතු නතර කිරීම සම්බන්ධව තොරතුරු ලේඛනගත නොකිරීම
  - ව්‍යාපාරයක පැවති ද්‍රවශීලතා අර්බුදයක් හේතුකොට ආයතනය අදාළ වන්නා වූ කර්මාන්තයේ, ආර්ථිකමය පසුබිමේ හා නීතිමය පසුබිමට අදාළ තොරතුරු ලේඛනගත කිරීමෙන් වැළකී සිටීම
- ආයතනයේ ගිණුම්කරණ පද්ධතිය හා අභ්‍යන්තර පාලන පද්ධතිය විගණක විසින් අවබෝධකර ගන්නා ලද ආකාරය
- විගණක විසින් යොදා ගෙන තිබෙන නියදිකරණ තාක්ෂණ
- ගනුදෙනු හා ශේෂ විශ්ලේෂණයන්
- වැදගත් අනුපාත හා උපනති විශ්ලේෂණයන්
- හඳුනාගන්නා ලද සහ තක්සේරු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ මූල්‍ය ප්‍රකාශන මට්ටමෙහි සහ සැඳැහුම් මට්ටමේදී ඇතුළත් වීමේ අවදානම
- සහායකයින් විසින් ඉටුකරන ලද වැඩ අධීක්ෂණය කළ බවටත් සමීක්ෂණය කළ බවටත් සාක්ෂි
- විගණන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමේ දී ව්‍යතිරේකයන් හෝ අසාමාන්‍ය කරුණු හෙළිදරුව්වූයේ නම්, එම කරුණු නිරාකරණය කරගත් හෝ සලකන ලද ආකාරය ඇතුළු වැදගත් විගණන අංශ සම්බන්ධයෙන් එළැඹි නිගමන
- වෙනත් විගණකයින්, විශේෂඥයන් සහ තුන්වන පාර්ශවයන් විසින් ඉටුකළ කාර්යයන් ඇගයීම සඳහා අනුගමනය කරන ලද විගණන පටිපාටිය පිළිබඳ විස්තර

#### 2.2 ප්‍රමාණවත් අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අපොහොසත්වීම

විගණන 15 ක ලේඛනගත කිරීම්වල මූල්‍ය ප්‍රකාශන සැඳැහුම් තහවුරු කිරීමේදී, තහවුරු ක්‍රියා පටිපාටිවලින් සහ පාලන පරීක්ෂාවලින් ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලැබී තිබුණු බවට සටහන් නොතිබිණි.

එම අඩුපාඩු නම්:

- විකුණුම්, ගැණුම්, පොළී ආදායම්, පොළී වියදම්, ක්ෂයවීම්, දේපළ පිරියත හා උපකරණ, ආයෝජන, තොග, කල්බදු සහ කුලීපිට ගැනුම් සම්බන්ධ ලැබිය යුතු මුදල්, සම්බන්ධිත පාර්ශ්වයන් ගෙන් ලැබිය යුතු මුදල්, ගෙවිය යුතු මුදල් සහ ප්‍රකාශිත ප්‍රාග්ධනය සම්බන්ධ මූල්‍ය ප්‍රකාශන සැඳැහුම් පරීක්ෂා කිරීමට විගණන පටිපාටි ක්‍රියාත්මක නොකිරීම
- විලම්බිත බදු සඳහා වෙන් නොකිරීම පිළිබඳ විගණන වැඩ සටහනේ සඳහන් කිරීම හැර විලම්බිත බදු සඳහා වෙන් නොකිරීම පිළිබඳ අනුගමනය කළ විගණන පටිපාටිය සම්බන්ධ සාක්ෂි නොතිබීම
- ලැබිය යුතු මුදල් තහවුරු කිරීම පිණිස කළ ඉල්ලීමක් හැරුණු විට එම ලැබිය යුතු මුදල් සම්බන්ධ පැවැත්ම, සම්පූර්ණ බව සහ එහි අගය තහවුරු කිරීමට අනුගමනය කළ විගණන පටිපාටි සම්බන්ධව සාක්ෂි නොතිබීම
- ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වල නිවැරදි බව සහ සම්පූර්ණ බව සොයා බැලීමට අදාළ සාක්ෂි නොතිබීම

  නිදර්ශන:

  ධාරණ අගය රු. මිලියන 225 ක දේපළක් විලම්බිත බදු ගණනය කිරීමේදී සැලකීමට අතපසු වීම
- වැරදි නිවැරදි කිරීමක් ලෙස සම්මත කළ ප්‍රමාණාත්මක ජර්නල් සටහනක නිරවද්‍යතාවය සොයා බැලීමට අතපසු වීම
- මූල්‍ය ප්‍රකාශන වල ඉහළ වගකීමක් හෙළිදරව් කරන ලද අවස්ථාවක තත්‍ය විශ්‍රාම ප්‍රතිලාභ සම්බන්ධ ගණනය පිරික්සීමට භාජනය නොකිරීම
- වැඩ පත්‍ර අනුව ඇතැම් ආයෝජන වල හිමිකාරත්ව ප්‍රතිශතය පරිපාලක පරිපාලිත සම්බන්ධයක් පෙන්නුම් කරන ලද අවස්ථාවක ඒකාබද්ධ ගිණුම් පිළියෙළ නොකිරීමට හේතු නොවිමසීම

# විගණන සමාලෝචනවල සොයාගැනීම්

**2.3 විගණන සැලසුම් සහ විගණන වැඩසටහන් නොතිබීම**

සමස්ත විගණන ක්‍රියාවලිය සහ විගණන ගිවිසුම් සම්බන්ධ ප්‍රමාණාත්මක වෙනස්කම් ඇතුළත් විගණන සැලැස්ම පිළිබඳ ලේඛනගත කිරීම් විගණන 14 සම්බන්ධව නොතිබිණි

**2.4 ප්‍රමාණාත්මකභාවය ගොඩනගා ගැනීමට අපොහොසත්වීම**

විගණන පටිපාටිවල ස්වභාවය, කාල නියමය සහ ප්‍රමාණය තීරණය කිරීමේ දී හා වැරදි ප්‍රකාශවල බලපෑම ඇගයීමේ දී ප්‍රමාණාත්මකභාවය ගොඩනගා ගැනීම සම්බන්ධ සටහන් විගණන 14 ක නොතිබිණි.

**2.5 පාලන අවදානම සම්බන්ධ අවබෝධය සහ තක්සේරුව**

ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන ක්‍රම සහ පාලන අවදානම සම්බන්ධව විගණක විසින් ලබාගත් අවබෝධය පිළිබඳව තොරතුරු විගණන 14 ක ලේඛනගතවී නොතිබිණි.

**2.6 විගණන මතයට පදනම් වූ කරුණු සම්බන්ධ සාක්ෂි නොතිබීම**

විගණන මතයට පදනම් වූ කරුණු සම්බන්ධව සොයාගැනීම් හා එළඹි නිගමන විගණන 6 ක වැඩ පත්‍ර වල ලේඛනගත වී නොතිබුණි.

**2.7 විගණන පටිපාටිය පදනම් කිරීමට ප්‍රමාණවත් සැලැසුම් යොදා නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හඳුනාගැනීමට අපොහොසත් වීම**

විගණන 4 ක ගනුදෙනු වර්ග, ගිණුම් ශේෂ, ඉදිරිපත් කිරීම් හා හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් සැලැසුම් ප්‍රමාණවත් අයුරින් යොදා නොගැනීම හේතුවෙන් ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශ ඇතුළත් වීමේ අවදානම මැනීමට සහ තවදුරටත් කළයුතු විගණන පටිපාටි සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට පදනමක් සකස් කිරීමට අපොහොසත් වී තිබේ. ඒ අනුව හඳුනා ගැනීමට අපොහොසත් වූ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වූ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ පහත දැක්වේ:

- ආයෝජන දේපළ, දේපළ පිරියත හා උපකරණ ලෙස හඳුනාගෙන ඉදිරිපත් කර තිබීම
- ශේෂ පත්‍ර දිනට පසු හුවමාරු සුරැකුම් වල වූ වෙළඳපොළ අගය අඩුවීම සඳහා වෙන් කිරීමක් සාවද්‍ය ලෙස ගිණුම්ගත කිරීම
- අනාගතයේ ව්‍යාපාරික ප්‍රවර්ධන හා විදේශ සංචාර සඳහා වැය කිරීමට යෝජිත වියදම් වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම
- පරිපාලිත සමාගමක පාලනය අඩුවීමෙන් වූ ලාභය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ ඇතුළත් කිරීම
- විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම් නොකිරීම
- විලම්බිත බදු සඳහා වෙන්කිරීම් නොකිරීම
- වත්කමක අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය නියෝජනය වන ආකාරයේ ක්ෂය ක්‍රමයක් අනුගමනය නොකිරීම
- මූල්‍ය සමාගමක් සම්බන්ධ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් කිරීමෙන් බැහැරවීම

**3. පොදු සොයාගැනීම්**

සමාලෝචනය කළ විගණන ලේඛන වලින් වැඩි ප්‍රමාණයක විගණන වාර්තාවේ පදනම සම්බන්ධව ප්‍රමාණාත්මක හා උචිත ලෙස සටහන් කර නොමැති බව තහවුරු විය.

ඇතැම් අවස්ථා වල ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල වීමේ අරමුණෙන් විගණන ආයතන මගින් තත්ත්ව පාලන ප්‍රතිපත්ති සහ පටිපාටීන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ලේඛනගත කිරීම් කර නොතිබිණි.

තවත් අවස්ථාවල විගණක විසින් භෞතික තොග ගණනයට සහභාගී නොවූ අවස්ථාවන් හි තොග සම්බන්ධ සාක්ෂි ලබා ගැනීම පිණිස අනුගමනය කළ විකල්ප විගණන පටිපාටි සම්බන්ධ සාක්ෂි වැඩ පත්‍ර වල ඇතුළත් නොවිය.

සම්බන්ධිත පාර්ශ්ව අතර ගනුදෙනු නිවැරදිව හඳුනාගැනීමට සහ හෙළිදරව් කිරීමට අපොහොසත් වීම, විගණන මතය නිවැරදිව ප්‍රකාශ කිරීමට අපොහොසත් වීම සහ 2007 අංක 7 දරන සමාගම් පනත සහ 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතට අනුකූලව අනාවරණය කළයුතු අනෙකුත් වාර්තාකරණ වගකීම් ඉටුකිරීමට අපොහොසත් වීම, විගණන සමාලෝචන වල දී හමුවූ අනෙකුත් වැදගත් සොයා ගැනීම් වේ.

# තුලිත ලකුණු පත

මණ්ඩලය විසින් වාර්ෂික ක්‍රියාකාරක සැලසුම් කිරීම පිණිස තුලිත ලකුණු පත යොදාගනු ලැබේ. 2012 සැලැස්ම, 2012 තථ්‍ය සටහන සහ 2013 සැලැස්ම පහත දැක්වේ:

### මූල්‍ය ප්‍රකාශන පරිලෝකය

අපගේ පරිකල්පනමය ලගාකර ගැනීම පිණිස, මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට අප කෙසේ දිස්විය යුතුද?

| ඉලක්කය | මිණුම් දණ්ඩ | 2012 සැලැස්ම | 2012 තථ්‍ය සටහන | 2013 සැලැස්ම |
|---|---|---|---|---|
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වීම | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලවීම නිශ්චය කිරීමට මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම | මූල්‍ය ප්‍රකාශන 300 | මූල්‍ය ප්‍රකාශන 302 | මූල්‍ය ප්‍රකාශන 750 |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලවීම නිශ්චය කිරීමට විගණන සමාලෝචනය කිරීම | විගණන 50 | විගණන 50 | විගණන 50 |

### නියාමන ව්‍යවසා පරිලෝකය

අපගේ පරිකල්පනමය ලගාකර ගැනීම පිණිස අප විසින් නියාමනයට භාජනය කරන ආයතන වලට අප කෙසේ දිස්විය යුතුද?

| ඉලක්කය | මිණුම් දණ්ඩ | 2012 සැලැස්ම | 2012 තථ්‍ය සටහන | 2013 සැලැස්ම |
|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන ලැබීම් | ලැබුණු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 1,256 | 1,443 (සටහන 1) | 1,313 |

### අභ්‍යන්තර ක්‍රියාදාම පරිලෝකය

විශේෂ උනන්දුවක් දක්වන පාර්ශවයන් තෘප්තිමත් කිරීම පිණිස අප කුමන අභ්‍යන්තර ක්‍රියාදාමයක් උත්කෘෂ්ටව පවත්වා ගත යුතුද?

| ඉලක්කය | මිණුම් දණ්ඩ | 2012 සැලැස්ම | 2012 තථ්‍ය සටහන | 2013 සැලැස්ම |
|---|---|---|---|---|
| සේවක කාර්ය සාධනය | වාර්ෂික සැලසුම්ගත කාර්ය සාධන ලකුණු ලගාකර ගැනීම (සටහන 2) | 11,532 | 10,898 | 29,628 |
| වර්තමාන මෙහෙයුම් ඉලක්ක ලගාකර ගැනීම පිණිස ඇති බාධක ඉවත්කර ගැනීම සඳහා දැනුම වැඩිදියුණු කර ගැනීම | සතිපතා අධ්‍යාපන ක්‍රියාවලිය (අභ්‍යන්තරව) | ප්‍රමිති සම්බන්ධ ඉදිරිපත් කිරීම් 48 | ප්‍රමිති සම්බන්ධ ඉදිරිපත් කිරීම් 48 | ප්‍රමිති සම්බන්ධ ඉදිරිපත් කිරීම් 48 |
| කාලීන ප්‍රතිචාර | ලැබුණු චෝදනා හා ඉල්ලුම් කළ පැහැදිලි කිරීම් සහ ලැබු තොරතුරු පිළිබඳ අවධානය යොමු කිරීම | සාමාන්‍ය වශයෙන් ලැබුණු හා පිළිතුරු යැවූ දිනයන් හැර දින 5 | දින 3.8 | සාමාන්‍ය වශයෙන් ලැබුණු හා පිළිතුරු යැවූ දිනයන් හැර දින 5 |

***සටහන 1***

මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ, පෙර වර්ෂ සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව පරීක්ෂාකාරීව කරන ලද පසුක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස ලැබුණු මූල්‍ය ප්‍රකාශන.

***සටහන 2***

කාර්ය සාධන ලකුණු, මණ්ඩලයේ කාර්යභාරයන් ගේ ස්වභාවය සහ ප්‍රමාණයන් මත පදනම් වී ඇත.

# විගණකාධිපති වාර්තාව

## විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. – එෆ්බී/අයි/එස්එල්ඒඒඑස්එම්බී/2012 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | දිනය<br>திகதி<br>Date – 2013 නොවැම්බර් 19 දින |

සභාපති,

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ 33(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2013 ජූනි 21 දින නිකුත් කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම් හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දුව පාර,
බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி,
புத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road,
Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone – 2887028 - 34

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. – 2887223

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. – oaggov@sltnet.lk

# විගණකාධිපති වාර්තාව

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකාරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**<u>මූල්‍ය ප්‍රකාශන</u>**

**මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**<u>පාර්ලිමේන්තුවට වාර්තා කිරීම</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත.

**එච්.ඒ.එස්. සමරවීර**
*විගණකාධිපති*



SLAASMB
ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | 2012 දෙසැම්බර් 31 දිනට රු. | 2011 දෙසැම්බර් 31 දිනට රු. | 2011 ජනවාරි 1 දිනට රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 4 | **9,567,130** | 11,032,435 | 2,519,432 |
| තැන්පතු | 5 | **1,340,550** | 1,340,550 | 1,340,550 |
| | | **10,907,680** | 12,372,985 | 3,859,982 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 6 | **432,368** | 389,730 | 276,740 |
| ලැබිය යුතු දෑ | 7 | **1,595,223** | 1,204,415 | 1,041,734 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 8 | **45,557** | 2,980,160 | 528,465 |
| | | **2,073,148** | 4,574,305 | 1,846,939 |
| **මුළු වත්කම්** | | **12,980,828** | 16,947,290 | 5,706,921 |
| **වගකීම්** | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 9 | **6,880,492** | 8,563,026 | 350,736 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 10 | **3,979,293** | 3,809,959 | 3,509,246 |
| | | **10,859,785** | 12,372,985 | 3,859,982 |
| **ජංගම වගකීම්** | | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 11 | **–** | 4,086,687 | 1,178,871 |
| ගෙවිය යුතු දෑ | 12 | **2,121,043** | 487,618 | 668,068 |
| | | **2,121,043** | 4,574,305 | 1,846,939 |
| **මුළු වගකීම්** | | **12,980,828** | 16,947,290 | 5,706,921 |

27 වන පිටුවේ සිට 34 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසකි.

මණ්ඩලයේ සාමාජිකයන් සඳහා සහ ඔවුන් වෙනුවෙන් අනුමත කරමු.

මණ්ඩලයේ සභාපති

අධ්‍යක්ෂ ජනරාල්

මූල්‍ය හා පරිපාලන කළමනාකාරී

2013 පෙබරවාරි 28 දින

# මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | සටහන | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 13 | **43,178,222** | 36,800,894 |
| අඩු කළා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයට මුදාහල රාජ්‍ය ප්‍රදාන | | **2,500,000** | 2,500,000 |
| | | **40,678,222** | 34,300,894 |
| එකතු කළා - අයකර නොමැති අභ්‍යන්තර ගොඩනැගිලි සැලසුම් වියදම් ආපසු ලිවීම | | **41,642** | – |
| | | **40,719,864** | 34,300,894 |
| මණ්ඩලයේ සාමාජිකයන්ගේ දීමනා | | **(563,750)** | (306,100) |
| විගණන ගාස්තු | 14 | **(135,475)** | 93,409 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | **(15,568,361)** | (13,235,569) |
| පුවත්පත් දැන්වීම් | | **(2,100,568)** | (1,391,803) |
| කාර්යාල කුලී සහ ගොඩනැගිලි නඩත්තු වියදම් | | **(5,297,289)** | (5,320,648) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය පිරිවැය | 4 | **(2,728,631)** | (1,446,748) |
| විදුලි වියදම් | | **(1,117,148)** | (907,526) |
| සමාලෝචනය සඳහා වූ වෘත්තීය ගාස්තු | | **(2,490,000)** | (2,130,000) |
| ජාත්‍යන්තර සාමාජිකත්වයන් | | **(1,913,333)** | (1,847,744) |
| ජාත්‍යන්තර ගමන් වියදම් | | **(3,215,049)** | (2,217,140) |
| වෙනත් පරිපාලන වියදම් | | **(5,590,260)** | (5,591,025) |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/හිඟය | | **–** | – |

27 වන පිටුවේ සිට 34 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසකි.

SLAASMB
ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | සමුච්චිත අරමුදල<br>රු. |
|---|---|
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | – |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | – |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | – |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | – |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | – |

27 වන පිටුවේ සිට 34 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | සටහන | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | | – | – |
| ගැලපීම්: | | | |
| වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන | | 37,409,000 | 47,921,000 |
| මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනයට මාරු කළ විලම්බිත රාජ්‍ය ප්‍රදාන | | (43,178,222) | (36,800,894) |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබූ රාජ්‍ය ප්‍රදාන | | – | (9,000,000) |
| ක්ෂය වීම් | | 2,728,631 | 1,446,748 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | | – | 7,988 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 169,334 | 300,713 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර අතිරික්ත ආදායම | | (2,871,257) | 3,875,555 |
| තොගවල (වැඩිවීම)/අඩුවීම | | (42,638) | (112,990) |
| ලැබිය යුතු මුදල්වල (වැඩිවීම)/අඩුවීම | | (390,807) | (162,681) |
| ගෙවිය යුතු මුදල්වල වැඩිවීම/(අඩුවීම) | | 1,633,425 | (180,450) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | (1,671,277) | 3,419,434 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (1,263,326) | (967,739) |
| ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | (2,934,603) | 2,451,695 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | – | – |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | (2,934,603) | 2,451,695 |
| වර්ෂය ආරම්භයේ වූ මුදල් සහ මුදල් හා සමාන දෑ | | 2,980,160 | 528,465 |
| **වර්ෂය අවසානයේ වූ මුදල් සහ මුදල් හා සමාන දෑ** | 8 | 45,557 | 2,980,160 |

27 වන පිටුවේ සිට 34 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම, 2013 පෙබරවාරි 26 දින මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඒකඟතාවය මත අනුමත කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

මණ්ඩලයේ කාර්යභාරය වන්නේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, ඉදිරිපත් කිරීමේ දී හා විගණනයේ දී 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ නියමයන්ට අනුව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලවීම සමීක්ෂණය කිරීමයි.

2012 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ස්ථිර සේවකයන් 8 ක් සහ තාවකාලික සේවකයන් 3 ක් සේවය කරන ලදී. (2011 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයන් 8 ක් සහ තාවකාලික සේවකයන් 3 ක් විය.)

## 2. ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති

### මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනම මත පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ නියමයන් යටතේ සම්මත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇත.

SLFRS හා LKAS ලෙස පූර්ව ප්‍රතිෂ්ඨාපනය කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා බලාත්මක වේ.

SLFRS යන්නෙන්ද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ම අදහස් කළද, පසුගිය කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූල වුවාද හෝ එසේත් නැත්නම් අදාළ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූල වන බව දක්වන වගන්තියක් සඳහන් වුවාද යන්න නොසලකා, SLRS 1 - "ශ්‍රී ලංකා මූල්‍ය වාර්ථාකරණ ප්‍රමිති මුල් වරට භාවිතය" හි අරමුණු සඳහා, SLFRS සහ LKAS ලෙස පූර්ව ප්‍රතිෂ්ඨාපනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති මුල් වරට භාවිතයේදී, එය SLFRS මුල් වරට භාවිතයක් ලෙස සලකා ඇත.

SLFRS 1 - "ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මුල් වරට භාවිතය" පිළිබඳ අවශ්‍යතාවයන් සටහන් අංක 3 යටතේ අනාවරණය කර ඇත.

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදු වූ සිද්ධීන්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් පිළිබඳව අදාළභාවය අනුව අවශ්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කර ඇත.

### දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ පසු අගයට දක්වා ඇත. වත්කම්වල තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සරල රේඛීය ක්‍රමය යටතේ ක්ෂය සඳහා ප්‍රතිපාදනය කෙරේ.

| විස්තර | තක්සේරු කරන ලද ජීවිත කාලය |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 5 |
| කාර්යාල උපකරණ | වර්ෂ 4 |
| ගෘහ භාණ්ඩ | වර්ෂ 6-10 |
| පොත්පත් හා ප්‍රකාශන | වර්ෂ 3 |

මිලදී ගත් වර්ෂයට හා විකුණන ලද වර්ෂයට පාවිච්චි කරන ලද කාලයට අනුරූපව ක්ෂය ගණනය කරන අතර මිලට ගත් මාසයේදී මුළු මාසයටම ක්ෂය ගණනය කරන නමුත් විකුණන මාසයට ක්ෂය ගණනය නොකෙරේ.

පොත්පත් හා සඟරා හැර වටිනාකම රු. 7,500/- ට අඩු සියලුම අයිතමයන්, ගිණුම්කරණ ප්‍රමිති, විගණන ප්‍රමිති හා වටිනාකම රු. 1,000/- ට අඩු අනෙකුත් ප්‍රකාශන, මිලට ගත් වර්ෂ තුළදීම වියදමක් ලෙස සලකනු ලැබේ.

### තොග

තොග අගය කරන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමෙන් අඩු අගයටය. තොග පිරිවැය තීරණය කරන්නේ ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ (ප්‍ර.ලැ.ප්‍ර.නි.) පදනම අනුවය.

### ලැබිය යුතු දෑ

සියලුම ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තුගත අගයට දක්වන අතර, බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම් අවශ්‍යතාවය අනුව කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**මුදල් සහ මුදල් හා සමාන දෑ**

බැංකුවේ සහ අතැති මුදල් සහ කල්පිරෙන දින තෙක් ඇති කෙටිකාලීන තැන්පතු, ඒවායේ පිරිවැයට දැක්වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් සහ බැංකු තැන්පතුවලින් බැංකු අයිරා හිලව් කිරීමෙනි.

**ගෙවිය යුතු දෑ**

ගෙවිය යුතු දෑ සඳහා වගකීම, ගෙවීමට බලාපොරොත්තුවන මුදල් සහ මුදල් හා සමාන දෑ වල වටිනාකමට දැක්වේ.

**විශ්‍රාම ප්‍රතිලාභ**

1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනත අනුව ගෙවිය යුතු පාරිතෝෂික සඳහා වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල කර ඇති අතර, මෙහිදී කිසියම් සේවකයෙක් පනතට අනුකූලව පාරිතෝෂික හිමිවීමට අදාළ නිශ්චිත සේවා කාලය සම්පූර්ණ කර නොතිබුණත් එවැනි සේවකයින්ට පවා මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශනයේ දිනට සේවක පාරිතෝෂික සඳහා හිමිකම් ඇත්තේය යන පදනම මත පිහිටා වෙන්කිරීම් කර ඇත.

**රාජ්‍ය ප්‍රදාන**

ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයෙන් ලද රාජ්‍ය ප්‍රදාන ආදායමක් ලෙස හඳුනාගන්නේ අදාළ වියදම හඳුනාගනු ලබන කාලපරිච්ඡේදයේදීමය.

ඉදිරි කාලපරිච්ඡේදයන් තුළ වියදමක් වන වත්කම් අත්පත් කරගැනීම සඳහා භාවිතා කරනු ලබන රාජ්‍ය ප්‍රදාන විලම්බිත ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

මුදල් සහ මුදල් හා සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම්වලින් වගකීම් (ලැබුණු රාජ්‍ය ප්‍රදානවලට අදාළ වගකීම් හැර) අඩු කළ විට නිරූපණය වන රාජ්‍ය ප්‍රදාන වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

### 3. SLFRS සහ LKAS ලෙස පූර්ව ප්‍රතිෂ්ඨාපනය කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට සංක්‍රමණය වීම

SLFRS සහ LKAS ලෙස පූර්ව ප්‍රතිෂ්ඨාපනය කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති (SLFRS ලෙස හඳුන්වන) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති SLFRS 1, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති (SLFRS) මුල් වරට භාවිතය මගින් නියම කෙරෙන පරිදි, SLFRS භාවිතා කිරීම නිසා පසුගියවර වාර්තා කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට සිදු කෙරෙන ගැලපුම් සැසඳීම් වශයෙන් අනාවරණය කිරීම අවශ්‍ය වේ.

ඒ අනුව, පහත සඳහන් ප්‍රකාශනවල පසුගියවර වාර්තා කළ ශේෂි අයිතමයන් සහ ගැලපුම් කල ශේෂි අයිතමයන් පහත ඉදිරිපත් කර ඇත:

1. 2011 ජනවාරි 1 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය
2. 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය
3. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනය

**2011 ජනවාරි 01 දිනට (SLFRS වෙත සංක්‍රමනය වන දිනය) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සහ ස්කන්ධයේ සැසඳීම**

| | සටහන | පසුගිය වර වාර්තා කල<br>රු. | SLFRS වෙත සංක්‍රමණය වීම නිසා වූ බලපෑම<br>රු. | SLFRS<br>රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | | 2,519,432 | – | 2,519,432 |
| තැන්පතු | | 1,340,550 | – | 1,340,550 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 3,859,982 | – | 3,859,982 |
| තොග | | 276,740 | – | 276,740 |
| ලැබිය යුතු දෑ | | 1,041,734 | – | 1,041,734 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | 528,465 | – | 528,465 |
| **මුළු ජංගම වත්කම්** | | 1,846,939 | – | 1,846,939 |
| **මුළු වත්කම්** | | 5,706,921 | – | 5,706,921 |
| **වගකීම්** | | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 3.2 | 748,299 | (397,563) | 350,736 |
| නිශ්චිත ප්‍රතිලාභ ප්‍රතිපාදන | 3.1 | 3,111,683 | 397,563 | 3,509,246 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 3,859,982 | – | 3,859,982 |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | | 1,178,871 | – | 1,178,871 |
| ගෙවිය යුතු දෑ | | 668,068 | – | 668,068 |
| **මුළු ජංගම වගකීම්** | | 1,846,939 | – | 1,846,939 |
| **මුළු වගකීම්** | | 5,706,921 | – | 5,706,921 |
| **මුළු වත්කම් අඩුකිරීම මුළු වගකීම්** | | – | – | – |
| **මුළු ස්කන්ධය** | | – | – | – |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2011 දෙසැම්බර් 31 දිනට (පසුගිය ප්‍රමිති භාවිතාකර ඉදිරිපත් කළ කාලපරිච්ඡේදයේ අවසානය) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සහ ස්කන්ධයේ සැසඳීම**

| | සටහන | පසුගිය වර වාර්තා කළ<br>රු. | SLFRS වෙත සංක්‍රමණයවීම නිසා වූ බලපෑම<br>රු. | SLFRS<br>රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | | 11,032,435 | – | 11,032,435 |
| තැන්පතු | | 1,340,550 | – | 1,340,550 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 12,372,985 | – | 12,372,985 |
| තොග | | 389,730 | – | 389,730 |
| ලැබිය යුතු දෑ | | 1,204,415 | – | 1,204,415 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | 2,980,160 | – | 2,980,160 |
| **මුළු ජංගම වත්කම්** | | 4,574,305 | – | 4,574,305 |
| **මුළු වත්කම්** | | 16,947,290 | – | 16,947,290 |
| **වගකීම්** | | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 3.2 | 8,526,348 | 36,678 | 8,563,026 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 3.1 | 3,846,637 | (36,678) | 3,809,959 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 12,372,985 | – | 12,372,985 |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | | 4,086,687 | – | 4,086,687 |
| ගෙවිය යුතු දෑ | | 487,618 | – | 487,618 |
| **මුළු ජංගම වගකීම්** | | 4,574,305 | – | 4,574,305 |
| **මුළු වගකීම්** | | 16,947,290 | – | 16,947,290 |
| **මුළු වත්කම් අඩුකිරීම මුළු වගකීම්** | | – | – | – |
| **මුළු ස්කන්ධය** | | – | – | – |

**3.1** පෙර භාවිතා කළ ප්‍රමිතිය අනුව, නිශ්චිත ප්‍රතිලාභ ප්‍රතිපාදන මිනුම්කරණය සිදුකරන ලද්දේ අදාළ සේවකයා පාරිතෝෂික හිමිවීමට අදාළ නිශ්චිත සේවා කාලය සම්පූර්ණකර නොතිබුණත් එවැනි සේවකයන්ට පවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනට සේවක පාරිතෝෂික සඳහා හිමිකම් ඇත්තේය යන පදනම මත පිහිටාය. නමුත් SLFRS අනුව, අදාළ වගකීමේ වර්තමාන අගය පහත උපකල්පන භාවිතා කරමින් මිනුම්කරණය සිදුකර ඇත.

| | 2011 ජනවාරි 1<br>% | 2011 දෙසැම්බර් 31<br>% |
|---|---|---|
| අපේක්ෂිත වැටුප් වර්ධකය | 10 | 10 |
| වට්ටම්/පොළී අනුපාතය | 9.15 | 11 |
| සේවක පිරිවැටුම් සාධකය | 9 | 9 |

**3.2** විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන යටතේ හඳුනාගෙන ඇති වටිනාකම මඟින් රාජ්‍ය ප්‍රදාන භාවිතාකර අත්පත් කරගත් වත්කම් (වගකීම් අඩුකර) නිරූපනය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ ප්‍රතිපාදන ලෙස හඳුනාගත් වටිනාකම ඉහළ යන විට අදාළ වගකීම සඳහා වන විලම්බිත රාජ්‍ය ප්‍රදාන ද ඊට සමාන වටිනාකමකින් ඉහල යන අතරම එවිට විලම්බිත ආදායම - රාජ්‍ය ප්‍රදාන වටිනාකම අඩුවේ.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනයේ සැසඳීම (පසුගිය ගිණුම් ප්‍රමිත භාවිතාකර ඉදිරිපත් කළ අවසාන කාලපරිච්ඡේදය)**

| | සටහන | පසුගියවර වාර්තා කල රු. | SLFRS වෙත සංක්‍රමණයවීම නිසා වූ බලපෑම රු. | SLFRS රු. |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| රාජ්‍ය ප්‍රදාන | 3.3 | 37,235,135 | (434,241) | 36,800,894 |
| අඩුකළා: ශ්‍රීලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයට මුදාහල රාජ්‍ය ප්‍රදාන | | 2,500,000 | – | 2,500,000 |
| | | 34,735,135 | (434,241) | 34,300,894 |
| **මෙහෙයුම් වියදම්** | | | | |
| මණ්ඩලයේ සාමාජිකයන්ගේ දීමනා | | (306,100) | – | (306,100) |
| විගණන ගාස්තු | | 93,409 | – | 93,409 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 3.3 | (13,669,810) | 434,241 | (13,235,569) |
| පුවත්පත් දැන්වීම් | | (1,391,803) | – | (1,391,803) |
| කාර්යාල කුලී හා ගොඩනැගිලි නඩත්තු වියදම් | | (5,320,648) | – | (5,320,648) |
| ක්‍ෂය සහ ක්‍රමක්‍ෂය පිරිවැය | | (1,446,748) | – | (1,446,748) |
| විචාරකයන්ගේ වෘත්තීය ගාස්තු | | (2,130,000) | – | (2,130,000) |
| වෙනත් පරිපාලන වියදම් | | (10,563,435) | – | (10,563,435) |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/හිඟය | | – | – | – |

**3.3** නිශ්චිත ප්‍රතිලාභ ප්‍රතිපාදන පදනම වෙනස්වීම නිසා, පෙර භාවිතා කළ ගිණුම් ප්‍රමිත භාවිතාකර වාර්තා කරන ලද කාර්ය මණ්ඩල පිරිවැය රු. 434,241/- කින් අඩු වී ඇත. එම අඩුවීම නිසා, වාර්ෂික වියදම සඳහා භාවිතා කළ රාජ්‍ය ප්‍රදාන වටිනාකම ද ඊට සමාන වටිනාකමකින් අඩුවී ඇත.

**3.4** ඉහත වෙනස්කම් නිසා මෙහෙයුම් මුදල් ප්‍රවාහයට කිසිදු වෙනසක් සිදු නොවේ. එම නිසා, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සැසඳීමක් අවශ්‍ය නොවේ.

## 4. දේපල, පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | | කාර්යාල උපකරණ | | ගෘහ භාණ්ඩ | | පුස්තකාල පොත් | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2012** | 2011 | **2012** | 2011 | **2012** | 2011 | **2012** | 2011 | **2012 දෙසැම්බර් 31** | 2011 දෙසැම්බර් 31 | 2011 ජනවාරි 1 |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **11,675,000** | 2,675,000 | **6,795,744** | 6,139,119 | **9,786,893** | 9,696,286 | **2,882,999** | 2,858,713 | **31,140,636** | 21,369,118 | 20,958,709 |
| එකතු කිරීම් | **–** | 9,000,000 | **1,142,527** | 756,615 | **–** | 186,838 | **120,799** | 24,286 | **1,263,326** | 9,967,739 | 1,277,156 |
| ඉවත් කිරීම් | **–** | – | **–** | (99,990) | **–** | (96,231) | **–** | – | **–** | (196,221) | (866,747) |
| වර්ෂය අවසානයේ ශේෂය | **11,675,000** | 11,675,000 | **7,938,271** | 6,795,744 | **9,786,893** | 9,786,893 | **3,003,798** | 2,882,999 | **32,403,962** | 31,140,636 | 21,369,118 |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **3,194,998** | 2,674,998 | **5,088,146** | 4,531,074 | **8,999,906** | 8,893,546 | **2,825,151** | 2,750,068 | **20,108,201** | 18,849,686 | 18,716,090 |
| වර්ෂය තුළ ක්ෂය වියදම් | **1,800,000** | 520,000 | **686,025** | 657,061 | **186,446** | 194,604 | **56,160** | 75,083 | **2,728,631** | 1,446,748 | 1,000,331 |
| ඉවත් කිරීම් මත ක්ෂය | **–** | – | **–** | (99,989) | **–** | (88,244) | **–** | – | **–** | (188,233) | (866,735) |
| වර්ෂය අවසානයේ ශේෂය | **4,994,998** | 3,194,998 | **5,774,171** | 5,088,146 | **9,186,352** | 8,999,906 | **2,881,311** | 2,825,151 | **22,836,832** | 20,108,201 | 18,849,686 |
| වර්ෂය අවසානයේ ලියා හරින ලද අගය | **6,680,002** | 8,480,002 | **2,164,100** | 1,707,598 | **600,541** | 786,987 | **122,487** | 57,848 | **9,567,130** | 11,032,435 | 2,519,432 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| | 2012 දෙසැම්බර් 31 රු. | 2011 දෙසැම්බර් 31 රු. | 2011 ජනවාරි 1 රු. |
|---|---|---|---|
| **5. තැන්පතු** | | | |
| කාර්යාල කුලී තැන්පතු | 1,340,550 | 1,340,550 | 1,340,550 |
| **6. තොග** | | | |
| ලිපි ද්‍රව්‍ය | 432,368 | 389,730 | 276,740 |
| **7. ලැබිය යුතු දෑ** | | | |
| ඉදිරියට කළ ගෙවීම් | 1,515,223 | 1,124,415 | 961,734 |
| තැන්පතු | 80,000 | 80,000 | 80,000 |
| | 1,595,223 | 1,204,415 | 1,041,734 |
| **8. මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | |
| බැංකුවේ සහ අතැති මුදල් | 45,557 | 2,980,160 | 528,465 |
| **9. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන)** | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **8,563,026** | 350,736 | 579,088 |
| ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු සහ වැය කළ ප්‍රදාන | **1,263,326** | 967,739 | 1,277,156 |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබූ රාජ්‍ය ප්‍රදාන | **–** | 9,000,000 | – |
| වර්ෂය තුළ ක්ෂය සහ ක්‍රමක්ෂය පිරිවැය | **(2,728,631)** | (1,446,748) | (1,000,331) |
| කාර්යාල උපකරණ ඉවත් කිරීමේදී වූ අලාභය | **–** | (7,988) | (12) |
| සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනවල වර්ෂයේ වෙනස්වීම | **(169,334)** | (300,713) | (505,165) |
| වර්ෂය අවසානයේ ශේෂය | **6,928,387** | 8,563,026 | 350,736 |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම) වලට මාරු කිරීම් | **(47,895)** | – | – |
| | **6,880,492** | 8,563,026 | 350,736 |
| **නිරූපණය වන්නේ -** | | | |
| දේපල, පිරියත හා උපකරණ | **9,567,130** | 11,032,435 | 2,519,432 |
| තැන්පතු (ජංගම නොවන) | **1,340,550** | 1,340,550 | 1,340,550 |
| අඩු කළා: සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **(3,979,293)** | (3,809,959) | (3,509,246) |
| | **6,928,387** | 8,563,026 | 350,736 |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම) වලට මාරු කිරීම් | **(47,895)** | – | – |
| | **6,880,492** | 8,563,026 | 350,736 |
| **10. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන** | | | |
| **වර්ෂය ආරම්භයේ ශේෂය** | **3,809,959** | 3,509,246 | 3,004,081 |
| වර්ෂය තුළ ප්‍රතිපාදන | **332,351** | 351,279 | 347,788 |
| වර්ෂය තුළ පොළිය | **466,719** | 386,017 | 274,873 |
| ආයුගණක ප්‍රතිලාභ | **(629,736)** | (436,583) | (117,496) |
| වර්ෂය තුළ ගෙවීම් | **–** | – | – |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **3,979,293** | 3,809,959 | 3,509,246 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

ප්‍රතිපාදනයේ වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී පහත සඳහන් උපකල්පන භාවිතා කර ඇත:

| | |
|---|---|
| අපේක්ෂිත වේතන වර්ධන අනුපාතය | 10% |
| වට්ටම්/පොලී අනුපාතය | 12.25% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 9% |

පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනයට බාහිර අරමුදල් සම්පාදනයක් නොමැත.

| | 2012<br>දෙසැම්බර් 31<br>රු. | 2011<br>දෙසැම්බර් 31<br>රු. | 2011<br>ජනවාරි 1<br>රු. |
|---|---|---|---|
| **11. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම)** | | | |
| **වර්ෂය ආරම්භයේ ශේෂය** | 4,086,687 | 1,178,871 | 742,132 |
| තොග සහ ඉදිරියට කල ගෙවීම්වල වැඩිවීම/(අඩුවීම) | 433,446 | 275,671 | 12,438 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම/(අඩුවීම) | (2,934,603) | 2,451,695 | (499,972) |
| ගෙවිය යුතු දෑ වල (වැඩිවීම)/අඩුවීම | (1,633,425) | 180,450 | 924,273 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | (47,895) | 4,086,687 | 1,178,871 |
| විලම්බිත ආදායම් වලට මාරුකිරීම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන) | 47,895 | – | – |
| | – | 4,086,687 | 1,178,871 |
| නිරූපණය වන්නේ - | | | |
| තොග | 432,368 | 389,730 | 276,740 |
| ලැබිය යුතු දෑ | 1,595,223 | 1,204,415 | 1,041,734 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 45,557 | 2,980,160 | 528,465 |
| අඩුකළා: ගෙවිය යුතු දෑ | (2,121,043) | (487,618) | (668,068) |
| | (47,895) | 4,086,687 | 1,178,871 |
| විලම්බිත ආදායම් වලට මාරුකිරීම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන) | 47,895 | – | – |
| | – | 4,086,687 | 1,178,871 |
| **12. ගෙවිය යුතු දෑ** | | | |
| විගණන ගාස්තු | 368,526 | 233,051 | 442,984 |
| ගෙවිය යුතු අභ්‍යන්තර ගොඩනැගිලි සැලසුම් වියදම් | – | 41,642 | 41,642 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයට ගෙවිය යුතු ප්‍රදාන | 625,000 | – | – |
| ගෙවිය යුතු සමාලෝචන සඳහා වූ වෘත්තිය ගාස්තු | 340,000 | – | – |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල දිරි දීමනා | 325,000 | – | – |
| වෙනත් ගෙවිය යුතු දෑ | 462,517 | 212,925 | 183,442 |
| | 2,121,043 | 487,618 | 668,068 |

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **13. රාජ්‍ය ප්‍රදාන** | | |
| වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන | 37,409,000 | 47,921,000 |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබූ රාජ්‍ය ප්‍රදාන | – | (9,000,000) |
| ප්‍රාග්ධන වියදම් සඳහා යෙද වූ ප්‍රදාන | (1,263,326) | (967,739) |
| ශුද්ධ ජංගම වත්කම් සඳහා වැය කළ ප්‍රදාන | 4,134,583 | (2,907,816) |
| වර්ෂය තුළ ක්ෂය සහ ක්‍රමක්ෂය පිරිවැය | 2,728,631 | 1,446,748 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | – | 7,988 |
| සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 169,334 | 300,713 |
| මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන රාජ්‍ය ප්‍රදාන | 43,178,222 | 36,800,894 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **14. විගණන ගාස්තු** | | |
| වර්ෂයේ වියදම | 126,000 | 116,525 |
| පෙර වර්ෂ සඳහා ඌන/(අධි) වෙන් කිරීම් | 9,475 | (209,934) |
| | 135,475 | (93,409) |
| **15. කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| කාර්ය මණ්ඩල වේතන | 9,968,063 | 9,384,985 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,230,610 | 1,096,810 |
| සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල | 307,652 | 274,202 |
| සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය (සටහන 15.1) | 169,334 | 300,713 |
| වාහන කුලී | 1,066,240 | 1,448,655 |
| සමාලෝචනය සඳහා වූ වෘත්තීය ගාස්තු | 1,950,000 | – |
| වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | 876,462 | 730,204 |
| | 15,568,361 | 13,235,569 |
| **15.1 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය** | | |
| වර්ෂය තුළ ප්‍රතිපාදන | 332,351 | 351,279 |
| වර්ෂයේ පොලිය | 466,719 | 386,017 |
| ආයුගණක ප්‍රතිලාභ | (629,736) | (436,583) |
| | 169,334 | 300,713 |

**16. ප්‍රාග්ධන වගකීම්**

2012 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වගකීම් කිසිවක් නොමැත. (2011 දෙසැම්බර් 31 ට - නැත)

**17. අසම්භාව්‍ය වගකීම්**

2012 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නොමැත. (2011 දෙසැම්බර් 31 ට - නැත)

**18. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු වූ සිද්ධීන්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට හෝ හෙළිදරව් කිරීමට තරම් ප්‍රමාණාත්මක වූ සිද්ධීන් කිසිවක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදුවී නොමැත.

# නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත යටතේ කරනු ලැබූ නියෝග ප්‍රකාර පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත:

- 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලත් සමාගම්
- රක්ෂණ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑම සඳහා 1962 අංක 25 දරන රක්ෂණ පාලන කිරීමේ පනත යටතේ බලය පවරන ලද සමාගම්
- කල් බදු ව්‍යාපාර කටයුතු වල නිරතවී සිටින සමාගම්
- ණය නිශ්කාෂණ සමාගම්
- 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම්
- ඒකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලත් සමාගම්
- අරමුදල් පාලන සමාගම්
- ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑමට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලත් සමාගම්
- ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ලෙස ක්‍රියාකිරීමට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලත් සමාගම්
- 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර දී ඇති ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත සමාගම්
- අනෙකුත් සමාගම්
  - (අ) රුපියල් මිලියන 500 කට වැඩි වාර්ෂික පිරිවැටුමක් ඇති සමාගම්
  - (ආ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 100 කට වැඩිය තිබූ සමාගම්
  - (ඇ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේ දළ වත්කම් රුපියල් මිලියන 300 කට වැඩිය තිබූ සමාගම්
  - (ඈ) ඉකුත් වර්ෂය අවසානයේදී බැංකුවලට සහ අනිකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 100 කට වඩා වැඩි බැරකම් පැවති සමාගම්
  - (ඉ) කාර්ය මණ්ඩලයේ සේවකයින් 1,000 කට වැඩිය ඇති සමාගම්
- භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුක්ත රාජ්‍ය සංස්ථා
- ඉහත සඳහන් වර්ග වලින් කවර හෝ වර්ගයකට වැටෙන එක් සමාගමක් ඇතුළත් සමාගම් සමූහයක්. මෙම කාර්යය සඳහා 'සමාගම් සමූහය' යන්නෙන්, සමාගම් පනත යටතේ ස්වකීය ගිණුම් ඒකාබද්ධ කළ යුතු පාලක සමාගමක් හා එහි පාලිත සමාගම් අදහස් වේ.

# සටහන්

**ආයතනයේ නම**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති
සමීක්ෂණ මණ්ඩලය

**නෛතික තත්ත්වය**

1995 අංක 15 දරන පනත අනුව
සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත
මණ්ඩලයකි

**සංස්ථාපිත කරන ලද රට**

ශ්‍රී ලංකාව

**ප්‍රධාන කාර්යාලය**

තෙවන මහල
293, ගාලු පාර
කොළඹ 3
දුරකථන අංකය: 2301210
ෆැක්ස්: 2301211
විද්‍යුත් තැපෑල: **slaasmb@sltnet.lk**

**වෙබ් අඩවිය**

**www.slaasmb.org**

**විගණකවරුන්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

**බැංකුකරුවන්**

ලංකා බැංකුව

**නීති උපදේශකවරු**

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12

තෙවන මහල, 293, ගාලු පාර, කොළඹ 3, ශ්‍රී ලංකාව.